ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
கிராமிய வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை மற்றும் கட்டிடப்பொருட்கள் தொழில்மேம்பாட்டு இராஜாங்க அமைச்சு
STATE MINISTRY OF RURAL HOUSING AND CONSTRUCTION & BUILDING MATERIALS INDUSTRIES PROMOTION

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report
# 2021

CIDA



ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
நிர்மாணத் தொழில் அபிவிருத்தி அதிகாரசபை
CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)

Page No

# පටුන


1.0 විධායක සාරාංශය ........ 1

1.1 හැඳින්වීම ........ 1

1.2 දැක්ම, මෙහෙවර සහ අරමුණු ........ 1

1.3 ප්‍රධාන කාර්යයන් ........ 2

1.4 සංවිධාන ව්‍යුහය ........ 3

1.5 CIDA හි ප්‍රධාන අංශ ........ 4

1.6 අධිකාරිය යටතේ පවතින ආයතන/අරමුදල් ........ 4

2.0 ප්‍රගතිය සහ අනාගත දැක්ම ........ 5

2.1 කර්මාන්ත සේවා අංශය ........ 5

2.2 සංවර්ධන අංශය ........ 8

2.3 විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය ........ 12

2.4 ඉදිකිරීම් උපකරණ මෙහෙයුම් පුහුණු ඒකකය ........ 13

2.5 ඉදිකිරීම් උපකරණ නඩත්තු ඒකකය ........ 17

2.6 කර්මාන්ත පුහුණු අංශය ........ 22

2.7 නිවාස සැලසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානය ........ 24

2.8 මානව සම්පත් සහ පරිපාලන අංශය ........ 28

2.9 මූල්‍ය අංශය ........ 32

3.0 මූල්‍ය ප්‍රකාශන ........ 74

4.0 කාර්ය සාධන දර්ශක ........ 74

**1.0** විධායක සංරාංශය

**1.1** හැඳින්වීම

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධාන යටතේ ඉදිකිරීම් පුහුණු හා සංවර්ධනය සඳහා ආයතනයේ (ICTAD) අනුප්‍රාප්තිකයා ලෙස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) ස්ථාපිත කර ඇත.

**1.2** දැක්ම, මෙහෙවර සහ අරමුණු

දැක්ම

*"ගෝලීය ප්‍රමිතීන් හා සමගාමී දිවෙන විශ්වාසනීය හා කාර්යක්ෂම ඉදිකිරීම් කර්මාන්තයක් ශ්‍රී ලංකාවේ බිහිකිරීම"*

මෙහෙවර

*"තිරසර ජාතික සංවර්ධනයක් සඳහා දේශීය හා ගෝලීය අවශ්‍යතා සපුරාලීම පිණිස ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තියක්, රෙගුලාසි, ධාරිතා ගොඩනැගීම, සංවර්ධනය සහ තත්ත්ව ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම තුළින් ගතික සහ වෘත්තීය කර්මාන්ත සේවා සහතික කිරීම මගින් ඉදිකිරීම් කර්මාන්තයට උපාය මාර්ගික නායකත්වයක් සැපයීම".*

අරමුණු

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි දීර්ඝ වූ නිල නාමය මගින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි සමස්ත අරමුණු සහ ඉලක්කයන් පහත පරිදි පිළිබිඹු කරයි.

"ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද, ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීම සඳහාද, ඉදිකිරීම් සම්බන්ධව ජාතික උපදේශන සභාව පිහිටුවීම සඳහාද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහාද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අරමුදල පිහිටුවීම සඳහාද, කර්මාන්තයට අදාළ වෘත්තිකයන්, නිෂ්පාදකයන්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුභසාධනය සඳහා විධිවිධාන සැලසීම පිණිසද, ඉදිකිරීම් කටයුතුවලට අදාළ ආරවුල් නිරවුල් කිරීම සඳහාද, ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම සහ ඒ හා සම්බන්ධිත හෝ ඊට ආනුෂාංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි."

1.3 ප්‍රධාන කාර්යයන්

- ගරු අමාත්‍යතුමාගේ මගපෙන්වීම හා සමගාමීව ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳව ජාතික ප්‍රතිප්තිය ක්‍රියාත්මක කිරීම සහතික වීම.
- ඉදිකිරීම් අංශය තුළ තිරසාර වර්ධනය, ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීම තීව්‍ර කිරීම අරමුණු කර මෙම කර්මාන්තයේ නිරතව සිටින පාර්ශ්වකරුවන්ට අවශ්‍ය නායකත්වය ලබා දීම.
- වරින් වර නියම කරනු ලබන ආකාරයට ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු පාර්ශ්වකරුවන් ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම.
- බලශක්තිය කාර්යක්ෂමව පරිභෝජනය කළ හැකි වන ආකාරයට ගොඩනැගිලි සහ ආකෘති සැලසුම් කිරීම සඳහා විශේෂ අවධානයන් යොමු කිරීමෙන් ඉදිකිරීම් කර්මාන්තයේ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- ඉදිකිරීම් කර්මාන්තයට සහ එහි වර්ධනයට අදාළ වන්නා වූ ඕනෑම කරුණක් පිළිබඳව පර්යේෂණ කටයුතු ප්‍රකාශයට පත් කිරීම සහ ඒවා ව්‍යාප්ත කිරීම සහ නිසි පර්යේෂණයන් ප්‍රවර්ධනය කිරීම.
- අනෙකුත් අදාළ බලධාරීන්ගේ උපදෙස් සමඟ ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රමිතීන් විධිමත්ව සකස් කිරීම සහ ඒවා අනිවාර්ය සහ ඉච්ඡානුගත ප්‍රමිතීන් වශයෙන් වර්ග කිරීම.
- බලධාරියා විසින් විධිමත්ව සකසා ඇති පරිදි පරිචයන්, ක්‍රියා පටිපාටීන් හා ක්‍රියාවලීන් සහ ඉදිකිරීම් කර්මාන්තයට අදාළ ප්‍රලේඛනයන් ක්‍රියාවට නැංවීම.

පනතේ දක්වා ඇති සියලුම කාර්යයන් ආවරණය කරමින් අදාළ කාල රාමුව තුළ ඒවා ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගනිමින් සංයුක්ත සැලැස්ම පිළියෙල කර ඇත. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ප්‍රතිපත්තිය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත හා 2020 – 2024 දක්වා කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම අනුගමනය කරමින් 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත.

2021 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් කාල ඉලක්කයන් සමඟ හා එක් එක් ක්‍රියාකාරකම්වලින් අපේක්ෂිත ආදායම සහ ලබා ගත් ප්‍රගතිය අදාළ අංශ යටතේ විස්තරාත්මකව දක්වා ඇත.

1.4 සංවිධාන ව්‍යුහය


ජාතික උපදේශන සභාව
කළමනාකරණ මණ්ඩලය සභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (කර්මාන්ත සේවා)
අධ්‍යක්ෂ (කර්මාන්ත පුහුණු)
අධ්‍යක්ෂ (විද්‍යුත් යාන්ත්‍රික සේවා)
අධ්‍යක්ෂ (මූල්‍ය)
අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)
සංවර්ධන අංශය
අ) කර්මාන්ත සංවර්ධනය
ආ) තොරතුරු කළමනාකරණය
ඇ) තාක්ෂණ හා පර්යේෂණ
කර්මාන්ත සේවා අංශය
අ) උපදේශන සේවා
ආ) ඉදිකිරීම් ආර්ථිකය
කාර්මික පුහුණු අංශය
අ) ශිල්පී පුහුණු (NVQ මට්ටම IV සහ ඊට අඩු)
ආ) පර්යේෂණ හා සංවර්ධන
ඇ) කළමනාකරණ හා අධීක්ෂණ මට්ටම පුහුණු (NVQ මට්ටම V - VII)
විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය
අ) කර්මාන්ත සහය
ආ) ඉදිකිරීම් උපකරණ පුහුණු
ඇ) ඉදිකිරීම් උපකරණ
මූල්‍ය කළමනාකරණ අංශය
අ) ගිණුම්කරණය, අයවැය හා කළමනාකරණ තොරතුරු
ආ) තොග හා ප්‍රාග්ධන වත්කම් කළමනාකරණය
ඇ) අරමුදල් කළමනාකරණය, ආදායම් හා ගෙවීම්
මානව සම්පත් හා පරිපාලන අංශය
අ) මානව සම්පත් හා පරිපාලන
ආ) නඩත්තු
ඇ) ප්‍රසම්පාදන කළමනාකරණය
අභ්‍යන්තර විගණන ඒකකය
• කාර්යය සාධන අධීක්ෂණ ඒකකය
• නීති ඒකකය

### 1.5 CIDA හි ප්‍රධාන අංශ

පහත සඳහන් පරිදි මෙහෙයුම් අංශ 04 හතරක් මගින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සිය කාර්යයන් ඉටු කරන අතර සෑම අංශයක්ම අධ්‍යක්ෂවරයෙකු විසින් මෙහෙයවනු ලැබේ.

අ. කර්මාන්ත සේවා අංශය
ආ. සංවර්ධන අංශය
ඇ. විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය
ඈ. කාර්මික පුහුණු අංශය

### 1.6 අධිකාරිය යටතේ පවතින ආයතන/ අරමුදල්

i. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදලේ අරමුදල - අභ්‍යන්තර අරමුදල

ii. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල - ස්ථාපිත කිරීමට නියමිත

## 2.0 ප්‍රගතිය සහ අනාගත දැක්ම

### 2.1 කර්මාන්ත සේවා අංශය

කර්මාන්ත සේවා අංශය විසින් තාක්ෂණික පිරිවිතරයන්, සම්මත ලංසු ලියකියවිලි සහ ඉදිකිරීම් සංඛ්‍යාලේඛන පිළිබඳ තොරතුරු ප්‍රකාශනය ප්‍රසිද්ධ කිරීම, තාක්ෂණික සහ ප්‍රසම්පාදනය ගැටලු පිළිබඳ උපදේශනාත්මක සේවා සැපයීම, ආරවුල් විසඳීමේ විකල්ප පරිපාටි සඳහා පහසුකම් සැපයීම තාක්ෂණික විගණනයක් සිදු කිරීම, ඉදිකිරීම් ආර්ථිකය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම විනිශ්චයකරුවන් ලියාපදිංචි කිරීමේ හා නියාමනය කිරීම, හඳුනාගත් ඉදිකිරීම් කාර්යයන් පිළිබඳ ලේඛන පවත්වා ගැනීම මඟින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා පහසුකම් සැපයීම හා නියාමනය සිදු කරයි. ඉදිකිරීම් කර්මාන්තය ඵලදායී සහ කාර්යක්ෂම කිරීම සඳහා ඉදිකිරීම් කාර්යයන් විධිමත් කිරීම, සුසංගත කිරීම හා ක්‍රමානුකූල කිරීම මඟින් ඉදිකිරීම් කර්මාන්තයේ දියුණුවට මඟපෙන්වන ඉදිකිරීම් කර්මාන්තයේ සේවාදායකයින් උපදේශකයින්, කොන්ත්‍රාත්කරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, ආයෝජකයින්, සැලසුම්කරුවන් ආදී ඉදිකිරීම් කර්මාන්ත පාර්ශ්වකරුවන් සඳහා සේවා සපයයි.

උපදේශන සේවා අංශය සහ ඉදිකිරීම් අංශය ලෙස කර්මාන්ත සේවා අංශය උප අංශ දෙකකින් සමන්විත වේ.

#### a) උපදේශන සේවා

උපදේශන සේවා යනු ප්‍රාග්ධන සහ පුනරාවර්තන කාර්යයන් ආවරණය වන තාක්ෂණික, ආර්ථික සහ ඉදිකිරීම් විශේෂඥතාවය පිළිබඳ සංයෝජනයකි. රාජ්‍ය සහ පෞද්ගලික අංශ සේවාදායකයන් කොන්ත්‍රාත් කරුණු පිළිබඳ පැහැදිලි අර්ථකථනයක් සහ උපදෙස් අපේක්ෂා කිරීම වැඩිවෙමින් පවතින අතර ඉදිකිරීම් කර්මාන්තය වැඩිදියුණු කිරීම අප වෙත පැවරී ඇත.

2021 වර්ෂය තුළ උපදේශන සේවා උප අංශය මඟින් පහත ක්‍රියාකාරකම් සිදු කර ඇත

- ආරවුල් විසඳීමේ සේවා සැපයීම සඳහා විනිශ්චයකරුවන්ගේ සංචිතය ලියාපදිංචි කිරීම. විනිශ්චයකරුවන්ගේ ලැයිස්තුව 2016 වසරේ සිට CIDA වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතට අනුව, විනිශ්චයකරුවන් ලියාපදිංචි කිරීම අවශ්‍ය වේ. 2019 වසරේ ගැසට් පත්‍රයේ පළ කර ඇති අතර අධිකාරියේ ලියාපදිංචි විනිශ්චයකරුවන් සංඛ්‍යාව 57 කි. කොන්ත්‍රාත් සඳහා පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම මත 2021 වර්ෂය තුළ විනිශ්චයකරුවන් 14 දෙනෙකු පත් කර ඇත.

- තත්ත්ව කළමනාකරණ විගණකවරුන් ලියාපදිංචි කිරීම- 2021 වර්ෂයේදී ලියාපදිංචිය අලුත් කරන ලද තත්ත්ව කළමනාකරණ විගණකවරුන් සංඛ්‍යාව 06කි.

- ආරවුල් නිරාකරණ සේවා සඳහා බේරුම්කරුවන් පත් කිරීම සහ ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන සේවා සැපයීම.

මිල උච්චාවචනය, CIDA සම්මත ලංසු ලේඛන, තාක්ෂණික ප්‍රමිති, තාක්ෂණික පිරිවිතර සහ මාර්ගෝපදේශ ආදිය පිළිබඳ ලංසු ලියකියවිලි, කොන්ත්‍රාත් පරිපාලනය, ආරවුල් විසඳීම සහ මිල උච්චාවචනයන් පිළිබඳ CIDA සූත්‍රය (CIDA Formula) පිළිබඳ උපදේශන සේවා මෙම අංශය මඟින් සපයනු ලැබේ.

ඉහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධ කොන්ත්‍රාත් ආරවුල්වලට මුහුණ දුන් කොන්ත්‍රාත්කරුවන් මෙන්ම රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවක් වාචික සහ ලිඛිතව මෙම අංශයෙන් උපදෙස් ඉල්ලා සිටින ලදී. 2021 වර්ෂයේදී ඉහත සඳහන් කර ඇති කරුණුවලට අදාළව උපදේශන සේවා 3000ක් ලබා දී ඇත.
2021 වර්ෂය තුළ පහත සමථකරණ කටයුතු සිදු කරන ලදී.

1. KASE ඉංජිනියරින් - බිම් මහලේ පෙනිසිලින් අමුද්‍රව්‍ය ගබඩාව නිෂ්පාදන අංශයකට පරිවර්තනය කිරීම සඳහා සැලසුම් සහ කොන්ත්‍රාත්තුව. කොන්ත්‍රාත් අංකය SPMC/P/2015/03- රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

2. අනුදි කන්ස්ට්‍රක්ෂන්- වැසිකිලිය සඳහා යෝජිත වෙනස් කිරීම සහ නවීකරණය කිරීම - ගාලු උරුමය පදනම

3. සිංහ කන්ස්ට්‍රක්ෂන් - දේශීය වෛද්‍ය ආයතනයේ දෙපාර්තමේන්තු කිහිපයක් අලුත්වැඩියා කිරීම සහ වැඩිදියුණු කිරීම (AA1/3/2018/04) - දේශීය වෛද්‍ය ආයතනය

4. ආර්ච් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම - මිරිහාන සහ කුරුඳුවත්ත පොලිස් ස්ථානයන්හි පොලිස් බොජුන්හල සහ බැරැක්ක ගොඩනැගිල්ලේ ඉතිරි කාර්යයන් ඉදිකිරීම සහ අවසන් කිරීම- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

- ඉදිකිරීම් කර්මාන්තයේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් හරහා දිස්ත්‍රික්ක 25 ක දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. CIDA ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා පහත සඳහන් පරිදි දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් දිස්ත්‍රික්ක 17 ක ස්ථානගත කර ඇත.

CIDA ලියාපදිංචිය (ලියාපදිංචිය C7ට පහළ, අලුත් කිරීම, වැඩිදියුණු කිරීම), වැඩබිම් පරීක්ෂාව (ඩෙංගු පිළිබඳ දැනුවත් කිරීම, විශාලතම ව්‍යාපෘති පරීක්ෂාව ආදිය), උපදේශන සේවා, සම්මන්ත්‍රණ පැවැත්වීම, ශිල්පීන් ලියාපදිංචි කිරීම (NCASL සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරීක්ෂාව), ශ්‍රම සිකුරු නිපුණතා සංවර්ධන වැඩසටහන, දිස්ත්‍රික් කමිටු රැස්වීම සඳහා CIDA නියෝජිතයා, ප්‍රධාන කාර්යාලයෙන් පැවරෙන හදිසි කාර්යාල වැඩ සහ විශේෂ රාජකාරි සඳහා මාර්ගගතව ප්‍රතිචාර දැක්වීම (ප්‍රකාශන දත්ත එකතු කිරීම, හිඟ ඉදිකිරීම් ද්‍රව්‍ය සමීක්ෂණය ආදිය.)

b) **ඉදිකිරීම් ආර්ථික විද්‍යාව**

ඉදිකිරීම් ආර්ථික විද්‍යාව යනු ව්‍යාපෘතිය පුරාවට ප්‍රායෝගික සහ තිරසර මුල්‍ය තීරණ ගනු ලබන බව සහතික කරමින් ව්‍යාපෘති ආරම්භයේ සිට නිම කිරීම දක්වා ඉදිකිරීම් ක්‍රියාවලිය ආර්ථිකකරණය කිරීමේ ක්‍රියාවලියයි.

2021 වර්ෂය තුළ ඉදිකිරීම ආර්ථික උප අංශය මඟින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කර ඇත

- ශ්‍රී ලාංකීය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැලි දේශීය ඉදිකිරීම් ඉදිකිරීම්කරුවන්ට ජාත්‍යන්තර සන්නාමයන් බවට පත්වීම සඳහා හඳුනාගත් ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය පිරිවිතර, සම්මත ලියකියවිලි, සම්මත ලංසු ලියකියවිලි සකස් කිරීම, ප්‍රසිද්ධ කිරීම ක්‍රියාවට නැංවීම සහ සංශෝධනය කිරීම.

2021 වර්ෂයේදී ප්‍රසිද්ධියට පත් කරන ලද ලියකියවිලි;

1. කොවිඩ්-19 සහ ඩෙංගු රෝගය සඳහා සෞඛ්‍ය සහ ප්‍රතිශක්තිය වැඩි දියුණු කිරීමේ මාර්ගෝපදේශ
2. කොවිඩ්-19න් පසු ඉදිරි ගමන
3. ගොඩනැගිලි ව්‍යාපෘතිවල ඉදිකිරීම් අදියර සඳහා ඉදිකිරීම් හරිත මාර්ගෝපදේශය - පාරිසරික මාර්ගෝපදේශයකි
4. ඉදිකිරීම් කර්මාන්තය සඳහා හරිත අමුද්‍රව්‍ය ශ්‍රේණිගත කිරීමේ මාර්ගෝපදේශ

- ඉදිකිරීම් සහ නඩත්තු කටයුතු සඳහා ප්‍රසම්පාදන උපාය මාර්ග පිළිබඳව උපදෙස් දීම සහ විශේෂ පැවරුම් සඳහා උපදේශකයින්, විශේෂඥයින් සහ ආයතන යෙදවීම

- ශ්‍රී ලංකාවට ජාත්‍යන්තරව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දේශීය සන්නාමයක් බවට පත්වීමට අවශ්‍ය ඉදිකිරීම් සැලසුම් සකස් කිරීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පී ආයතනය, ඉංජිනේරු ආයතනය, විශ්වවිද්‍යාල සහ අනෙකුත් ආයතන සමඟ සහයෝගයෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය, සංරචක සහ ක්‍රියාවලි හරිත ශ්‍රේණිගත කිරීම සිදු කරන ලදී.

- ගොඩනැගිලි ද්‍රව්‍යවල උච්චාවචනය පිළිබඳ මාසික ප්‍රකාශයක් ප්‍රසිද්ධියට පත් කිරීමෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් ප්‍රමිතිකරණය කිරීම

ද්‍රව්‍යවල මිල, ශ්‍රමික වේතන සහ පිරියත කුලී අනුපාත එක්රැස් කර, පරීක්ෂා කිරීම සහ දර්ශක සකස් කිරීම සඳහා විශ්ලේෂණය කිරීම සිදු කරන ලදී. මෙම ප්‍රකාශනය ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් ව්‍යාපෘතිවල මිල උච්චාවචනය ගණනය කිරීම සඳහා යොදා ගනී. CIDA වෙබ් අඩවියේ ප්‍රකාශන 12ක් නොමිලේ ප්‍රකාශයට පත් කරන ලදී

කර්මාන්ත පාර්ශ්වකරුවන් තිදෙනෙකුගේ රැස්වීමක් පවත්වා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ද්‍රව්‍ය මිල හදිසියේ ඉහළ යාම තුලින් ඇතිවන බලපෑම්වලින් කොන්ත්‍රාත්කරුවන් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. පාරිභෝගික කටයුතු අධිකාරිය සහ මුදල් අමාත්‍යාංශය සමඟ අමාත්‍යාංශ රැස්වීමක් පැවැත්වීම. මාස තුනකට වඩා වැඩි කාලයක් ගතවන ව්‍යාපෘති සඳහා මිල උච්චාවචන සූත්‍රය භාවිතා කිරීම අනිවාර්ය කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් නිකුත් කරන ලදී.

## 2.2 සංවර්ධන අංශය

### i. <u>ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා ජාතික ලියාපදිංචි කිරීමේ සහ ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය</u>

ලියාපදිංචිය සහ ශ්‍රේණිගත කිරීම යනු කිසියම් නිශ්චිත කොන්ත්‍රාත්තුවක් වෙත යොමු නොවී විවිධ වර්ගවල සහ ප්‍රමාණයේ ව්‍යාපෘති භාර ගැනීමට ඔවුන්ගේ සාමාන්‍ය හැකියාව තීරණය කිරීම සඳහා විභව්‍ය කොන්ත්‍රාත්කරුවන්ගේ හැකියාවන් පිරික්සීමේ ක්‍රියාවලියකි. ලියාපදිංචිය සහ ශ්‍රේණිගත කිරීම කොන්ත්‍රාත්කරුගේ තාක්ෂණික හා මූල්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමෙන් තීරණය කරනු ලැබේ.

2021 වර්ෂය සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉලක්කය 3500 ක් වූ අතර සිදු සාක්ෂාත් කර ගන්නා ලද සංඛ්‍යාව 2563 කි. නව ලියාපදිංචි කිරීම්, යාවත්කාලීන කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම මෙයට ඇතුළත් වේ.

- **මාර්ගගත ලියාපදිංචි කිරීම – ඉහළ නැංවීමේ යෝජනාව**

මාර්ගගත ලියාපදිංචිය වැඩි දියුණු කිරීම සඳහා අරමුදල් ලබා දීමේ යෝජනාවක් අනුමත කර ඇත.

- **ඉදිකිරීම් ස්ථානවල කොවිඩ්-19 ආරක්ෂාව පිළිබඳ සමීක්ෂණය**

ඉදිකිරීම් ස්ථාන කොවිඩ්-19 අනුවර්තනය වීම පිළිබඳ තත්ත්වය විශ්ලේෂණය කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් (DCOs) හරහා සමීක්ෂණයක් සිදු කරන ලදී. මේ සඳහා ප්‍රතිචාර 700ක් ලැබුණි.

- **කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා සහන කාලයක් ලබා දීම**

කොවිඩ්-19 තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි වීම සඳහා 2021.05.01 දින සිට මාස 06ක සඳහා සහන කාලයක් ලබා දෙන ලදී. කොන්ත්‍රාත්කරුවන් 1218 මෙම සහන කාලයෙන් ප්‍රතිලාභ ලබා ඇත.

- **ජල සම්පාදන අංශයේ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය ලිහිල් කිරීම**

C1 කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ ඉහළම නම් කරන ලද සීමාව වන රුපියල් මිලියන 1500ට වැඩි විශාල ව්‍යාපෘති සඳහා අයදුම් කිරීමට හැකි වන අයුරින් ජල සම්පාදන අංශයේ කොන්ත්‍රාත්කරුවන්ට සහනයක් ලබා දෙන ලදී.

### ii. <u>දේපල සංවර්ධකයන් ලියාපදිංචි කිරීම</u>

පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා දේපල සංවර්ධන කර්මාන්තය විධිමත් කිරීම, අවසාන පරිශීලක තෘප්තිය සහ ආයෝජක විශ්වාසය වැඩි දියුණු කිරීම සහ ආරවුල් අවම කිරීම සහ කර්මාන්තයේ ප්‍රතිරූපය ගොඩනැගීම දේපල සංවර්ධකයින් ලියාපදිංචි කිරීමේ අරමුණු වේ.

**මේ දත්වා ක්‍රියාවලිය සහ ප්‍රගතිය**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත පනතට අනුව සහ අංක 42 වගන්තියේ විධිවිධාන යටතේ රෙගුලාසි සහ ඉන් පසුව නිකුත් කරන ලද අංක 2181/21 ගැසට් පත්‍රය 2020 ජුනි 25 දින ප්‍රකාශයට පත් කර ඇත.

දේපල සංවර්ධකයින් අංක 10 දෙනෙකු පමණක් 2021 වර්ෂය සඳහා ලියාපදිංචි කර ඇත.

දේපල සංවර්ධකයින් ලියාපදිංචි වීම මන්දගාමී වීම හේතුවෙන්, අවශ්‍යතාවයට අනුකූල වන ලෙස ඉල්ලා සිටිමින් සියලුම විභව්‍ය සංවර්ධකයින් වෙත දැනුම්වත් කිරීමේ ලිපි යවා ඇත. එසේම CIDA ලියාපදිංචිය අනිවාර්ය මෙන්ම ජාතික අවශ්‍යතාවයක් ලෙස සහ ඔවුන්ගේ අනුමත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතාවයක් ලෙස ඇතුළත් කරන මෙන් ඉල්ලා පළාත් පාලන ආයතන 341කට දැනුවත් කිරීමේ ලිපි යවා ඇත.

**දේපල සංවර්ධක - ජාත්‍යන්තර වෙළඳ සහ ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති යෝජනාව**

දේපල සංවර්ධකයන් ලියාපදිංචි කිරීමට "නිශ්චල දේපල නියෝජිතයන්" ඇතුළත් කිරීමේ අවශ්‍යතාවයක් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් ලැබුණි. ඒ පිළිබඳ මූලික අධ්‍යයනයක් සිදු කර රේඛීය අමාත්‍යාංශයට වාර්තා කර ඇත.

iii. <u>විදේශ කොන්ත්‍රාත්කරුවන්ගේ තාවකාලික ලියාපදිංචිය</u>

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 39 වැනි වගන්තිය මඟින් සහ පසුව නිකුත් කරන ලද 2018 අගෝස්තු 23 දිනැති 2085/19 ගැසට් නිවේදනය මඟින් විදේශීය කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සහ සේවයේ නියුක්ත කිරීම විධිමත් කරනු ලැබේ. 2016 වර්ෂයේදී සියලුම පාර්ශ්වකරුවන් නියෝජනය කරන කමිටුවක් මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසි පරිදි අනුමත කර තිබූ නිර්ණායක සකස් කරන ලදී.

ගැසට් නිවේදනය නිකුත් කරන අවස්ථාවේ දැනටමත් ව්‍යාපෘති ආරම්භ කර ඇති කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා දැඩි අවශ්‍යතාවලට අනුකූල නොවන සාධාරණ යාන්ත්‍රණයක් ද හඳුන්වා දිය යුතුය.

2021 වර්ෂය සඳහා විදේශීය කොන්ත්‍රාත්කරුවන් සඳහා ඉලක්කගත ලියාපදිංචිය 17 ක් විය. කෙසේ වෙතත්, වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, සමාලෝචිත කාලසීමාව තුළ විදේශීය කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව 23 ක් ලියාපදිංචි වී ඇත.

iv. <u>සුදුසුකම්ලත් පුද්ගලයින්/සමාගම් ලියාපදිංචි කිරීම</u>

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 26 සහ 33 වගන්ති ප්‍රකාරව ICTAD හි නීත්‍යානුකූල අනුප්‍රාප්තිකයා වන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට (CIDA), ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියාමන අධිකාරිය වශයෙන්, වෘත්තිමයභාවයේ ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින් සහ පරිචයන් එනම් දේශීය හා විදේශීය සම්බන්ධයන් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යෑම සඳහා පැවරුම් බලයක් ලැබී ඇත.

CIDA විසින් පහත සඳහන් කාණ්ඩවල පුද්ගලයින් සහ උපදේශන පරිවයන් ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇත.

a) ඉංජිනේරු, 1968 අංක 17 දරන ලංකා ඉංජිනේරු ආයතන පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය සමඟ සහයෝගිත්වයෙන්
b) ප්‍රමාණ සමීක්ෂණ, 1976 අංක 1 දරන ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පී ආයතන පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පී ආයතනය සහ ගෘහ නිර්මාණ ශිල්පී ලියාපදිංචි කිරීමේ මණ්ඩලය සමඟ සහයෝගිත්වයෙන්
c) ප්‍රමාණ සමීක්ෂණ, 2007 අංක 20 දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක (සංස්ථාගත කිරීමේ) පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය සමඟ සහයෝගිත්වයෙන්

2021 වර්ෂයේදී උපදේශන පරිවයන් පිළිබඳ පහත ලියකියවිලි මේ වනවිට සකස් කර ඇත.

➢ **ශ්‍රී ලාංකික උපදේශන පරිවයන්/ආයතන**

- ශ්‍රී ලාංකික උපදේශන පරිවයන් ලියාපදිංචි කිරීම සඳහා වන රීති සහ රෙගුලාසි
- ශ්‍රී ලාංකික උපදේශන පරිවයන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

➢ **විදේශ උපදේශන පරිවයන් (විදේශ උපදේශන පරිවයන්/ආයතන)**

- විදේශ උපදේශන පරිවයන් තාවකාලික ලියාපදිංචි කිරීම සඳහා නීති සහ රෙගුලාසි
- විදේශ උපදේශන පරිවයන් තාවකාලික ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය

සුදුසුකම්ලත් පුද්ගලයන් පිළිබඳ සමීක්ෂණයක් 2021.09.01 දින ආරම්භ කර 2021.09.14 දින අවසන් කර ඇති අතර ප්‍රතිචාර 700ක් පමණ ලැබී ඇත.

**<u>සුදුසුකම් පරීක්ෂා කිරීමේ කමිටුව ප්‍රතිව්‍යුහගත කිරීම</u>**

සාමාජිකයින් වැඩි පිරිසකගෙන් (NCASL සහ CCI) සමන්විත ප්‍රතිසංවිධානය කරන ලද සුදුසුකම් පරීක්ෂා කිරීමේ කමිටුවක් 2021 ජූනි මාසයේදී ස්ථාපිත කරන ලදී. පෙර (2018-2020) කමිටුව විසින් සකස් කරන ලද සමාගම් ලියාපදිංචි කිරීමේ ලේඛනය නැවත පරීක්ෂා කිරීම එයට පවරනු ලැබූ පළමු කාර්යය විය.

### v. ඉදිකිරීම් විශිෂ්ටත්වය සඳහා වන CIDA සම්මාන

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වෘත්තීයභාවය සහ විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කරන 1990 වර්ෂයේදී ආරම්භ කරන ලද වාර්ෂික සම්මාන යෝජනා ක්‍රමය අඛණ්ඩව 32 වැනි වරටත් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක විය. මෙම සම්මාන යෝජනා ක්‍රමය මඟින් ඉදිකිරීම් කළමනාකරණයේ කැපී පෙනෙන කාර්ය සාධනය, තාක්ෂණික විශේෂඥතාව සහ ගුණාත්මකභාවය පිළිබඳ ඉහළ වෘත්තීමයභාවය, නව්‍ය සහ අදාළ තාක්‍ෂණය හඳුන්වාදීම සහ ශිල්පීන් පුහුණු කිරීම සඳහා සහභාගිත්වය ආදිය හඳුනා ගනී.

කොවිඩ්-19 වසංගත තත්ත්වය සහ සංචාරක සීමා කිරීම් හේතුවෙන් වැඩබිම් සංචාර කල් දැමීමට සිදු විය.

එබැවින් 2021 වර්ෂය සඳහා සම්මාන සඳහා තෝරා ගන්නා ව්‍යාපෘතිවල අවසන් ඇගයීම 2022 වර්ෂයේදී පැවැත්විය යුතු විය. තවද 2020 සහ 2021 වර්ෂ සඳහා එක් උත්සවයක් 2022 වර්ෂයේ පළමු කාර්තුව තුළ පැවැත්වීමට තීරණය කරන ලදී.

**vi. CIDA හි තොරතුරු තාක්ෂණ පද්ධති**

තොරතුරු තාක්ෂණ යටිතල ව්‍යුහයට එක් කිරීමට පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනාගෙන ඇත

a. 2019/2020 වර්ෂයේදී පහත සඳහන් කාර්යයන් සම්පූර්ණ කරන ලදී

1. සුදුසුකම්ලත් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය
2. ගෙවීම් ද්වාර ඒකාබද්ධ කිරීම
3. වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම
4. ලේඛන කළමනාකරණ පද්ධතිය

b. පහත සඳහන් ප්‍රසම්පාදන කාර්යයන්/සංවර්ධන කාර්යයන් වර්ෂය තුළ සිදු කරමින් පැවතිණි.

1. දේපළ සංවර්ධකයන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය
2. විදේශ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය
3. ඉදිකිරීම් ද්‍රව්‍ය සහ සංරචක ආනයනකරුවන්, නිෂ්පාදකයින් සහ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය
4. හඳුනාගත් ඉදිකිරීම් කාර්යයන් පිළිබඳ තොරතුරු පද්ධතිය
5. තත්ත්ව කළමනාකරණ විගණකවරුන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය
6. ද්‍රව්‍ය පිරිවැය ගණනය කිරීමේ පද්ධතිය
7. විනිශ්චයකරුවන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය
8. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ ලියාපදිංචි කිරීමේ පද්ධතිය

**vii. කර්මාන්ත ගැටලු පිළිබඳ රැස්වීම් පැවැත්වීම**

කොන්ත්‍රාත්කරුවන් මෙන්ම කර්මාන්තයේ පාර්ශ්වකරුවන් මුහුණ දෙන පොදු ගැටලු විසඳීම සඳහා පාර්ශ්වකරුවන්ගේ උපදේශන රැස්වීම් දෙකක් පවත්වන ලදී.

**viii. ඉදිකිරීම් වැඩබිම්වල ඩෙංගු වැළැක්වීමේ කාර්යයන්/නිරීක්ෂණ කාර්යයන්**

වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රධාන කාර්යාලයේ නිරීක්ෂණ කණ්ඩායමට සැලසුම් කළ පරිදි පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියා කිරීමට නොහැකි විය. කෙසේවෙතත්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් (DCO) ඉදිකිරීම් ස්ථාන 297 ක සංචාරය කරමින් ඔවුන්ගේ සේවාවන් අඛණ්ඩව සිදු කරන ලදී.

## 2.3 විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය

**ඒකාබද්ධ අරමුදල් මඟින් පුනරුත්ථාපනය වන්නන් 100 දෙනෙකු බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුවන් ලෙස පුහුණු කිරීම**



වරක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිට පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ පුනරුත්ථාපනය වෙමින් සිටින තරුණයන්ගේ වෘත්තීය කුසලතා වර්ධනය කිරීමේ මෙම අගනා කර්තව්‍යයට CIDA හි විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය මැදිහත් විය. පුනරුත්ථාපනයෙන් පසු ඔවුන් සමාජගත කිරීමට පෙර NVQ 3 මට්ටමේ රාමුව යටතේ බැකෝ යන්ත්‍ර හැසිරවීමේ කුසලතා වර්ධනය කිරීමෙන් සක්‍රිය ශ්‍රම නාස්තිය අවම කරමින් ඉල්ලුමක් ඇති ඉදිකිරීම් උපකරණ මෙහෙයුම් ක්ෂේත්‍රයක ප්‍රයෝජනවත් ශ්‍රම කාණ්ඩයක් බවට පත් කිරීමේ ප්‍රතිලාභ ලැබෙනු ඇති අතර එයට සමගාමීව බැකෝ යන්ත්‍ර මෙහෙයුමේ වෘත්තීය කුසලතා ලබා ගැනීමත් සමඟ පුනරුත්ථාපනයෙන් පසු ඉක්මනින්ම ඔවුන්ගේ නැතිවූ ප්‍රතිරූපය නැවත වරක් ගොඩනගා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.



මෙම අඩු වරප්‍රසාදලාභී කණ්ඩායම ක්‍රියාකාරී ශ්‍රම බලකායට, විශේෂයෙන්ම බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුවන් ඉල්ලුමක් සහිත ශ්‍රම කාණ්ඩයක් ලෙස ඇතුලත් වන ඉදිකිරීම් ශ්‍රම කාණ්ඩවලට ඇතුළත් කර ගැනීමේ වැදගත්කම පිළිබඳව අවබෝධ කර ගනිමින් වසර පහක් තුළ රු.මිලියන 17.5 ක ඒකාබද්ධ අරමුදල් මඟින් පුනරුත්ථාපනය වන්නන් 500 දෙනෙකු බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුවන් ලෙස කුසලතා වර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණයි. 2021 වර්ෂයේදී රු. මිලියන 2.1ක් වැය කරමින් ව්‍යාපෘතිය මඟින් පුනරුත්ථාපනය වන්නන් 60 දෙනෙකුට වරප්‍රසාද හිමි විය.

මෙම කණ්ඩායම යෝග්‍ය ලෙස පුනරුත්ථාපනය කිරීමත් සමඟ බැකෝ යන්ත්‍ර මෙහෙයුම් වෘත්තීය කුසලතා වර්ධනය කිරීමේ මෙම විස්තීර්ණ මැදිහත්වීමේ උපාය මාර්ගයෙන් ඔවුන් සාර්ථක ලෙස සමාජයට සහ ක්‍රියාකාරී ශ්‍රම බලකායට ඇතුලත් වීම සහ අලුතින් වර්ධනය කරගත් වෘත්තීය කුසලතා සමඟ අලුත් ජීවිතයකට පිවිසීම ප්‍රතිඵලය වනු ඇත.

**2.4** ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ ඒකකය



දැක්ම :

"ඉදිකිරීම් කර්මාන්තයේ නියැලී සිටින සියලුම පුහුණුකරුවන් සහ සේවාදායකයින් සඳහා ප්‍රමුඛ සේවාවන් ලබාදීමට කැපවුණු ශක්තිය තුළින් සහ ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය නිපුණ ශ්‍රම බලකායක් සැපයීම මගින් වඩාත් ප්‍රමුඛතාවයකින් යුතු රාජ්‍ය සංවිධානය බවට පත්වීම"

මෙහෙවර:

"ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරවීම, නඩත්තුව සහ කළමනාකරණය පිළිබඳ කුසලතා සහ දැනුම ලබා දීම තුළින් දක්ෂ ශ්‍රම බලකායක් ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ බිහිකිරීම සහ එමගින් ඉදිකිරීම් නිෂ්පාදන ඵලදායිතාවයේ මැනිය හැකි වර්ධනයක් සාක්ෂාත් කර ගැනීම"

අරමුණු:

- ස්ථාපිත ජාතික නිපුණතා ප්‍රමිතීන් සඳහා ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් පුහුණු කිරීම.
- යන්ත්‍ර කළමනාකරණය හා අධීක්ෂණ කළමනාකරණය පිළිබඳ පාඨමාලා පැවැත්වීම.
- ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් සඳහා ජාතික වෘත්තීය පරීක්ෂණ හා **NVQ** පරීක්ෂණ පැවැත්වීම
- සිය කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායිතාවයෙන් යුතුව ඉටු කිරීම සඳහා ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන්ගේ හැකියාවන් ඉහළ නැංවීම
- ඉදිකිරීම් කර්මාන්තය සඳහා යන්ත්‍ර හා උපකරණ කුලියට දීම
- රාජ්‍ය ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි පාර්ශවකරුවෙකු වශයෙන් ජාතික සංවර්ධනයට දායක වීම සහ නවක ක්‍රියාකරුවන්ට අත්දැකීම් ලබා දීම.

හැඳින්වීම

ක්‍රෝලර් ට්‍රැක්ටර්ස්, ලෝඩර්ස්, එක්ස්කැවේටර්, මෝටර් ග්‍රේඩර්ස් වැනි ඉදිකිරීම් උපකරණවල ආරක්ෂාව, මූලික නඩත්තුව සහ මෙහෙයුම් තාක්ෂණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විද්‍යාල පුහුණුව ලබා දෙයි. ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විද්‍යාල සතුව ඉදිකිරීම් උපකරණ 63 ක සමූහයක් සහ පුහුණු නිලධාරින් හා ප්‍රදර්ශක නිලධාරින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඇත.

පුහුණුවන්නන් සඳහා කුසලතා ලබාදීම සඳහා පුහුණු කාලයෙන් 70 % ක් පමණ ප්‍රායෝගික පුහුණුව සඳහා වෙන්කර ඇති අතර ඉතිරි 30% න්‍යායාත්මක කරුණු සඳහා සීමාවේ. පුහුණුවන්නන් සඳහා රැකියාස්ථ පුහුණුව ලබාදෙන අතරම ආදායම් උත්පාදනය සඳහා සමහර ඉදිකිරීම් උපකරණ කුලියට දෙනු ලැබේ.

ඉහත සඳහන් කරන ලද ආකාරයට ක්‍රියාකරු පුහුණු කිරීමේ විද්‍යාලේ පුහුණු වැඩසටහන් ආයතනික පුහුණුවකින් සහ ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක වනවිට රැකියාස්ථ පුහුණුවෙන් සමන්විත වේ. ආයතනික පුහුණුව අවසන් කිරීමෙන් පසු අවම වශයෙන් මාස 03 ක කාලයක් රැකියාස්ථ පුහුණුව ලබා ගන්නා අභ්‍යාසලාභියෙකු NVQ සඳහා සුදුසුකම් ලබයි. ඉදිකිරීම් උපකරණ ශිල්පීන්ට NVQ පරීක්ෂණ පහසුකම් සැපයීම සඳහා NAITA විසින් ක්‍රියාකරු පුහුණු කිරීමේ විද්‍යාල (OTC) පිළිගෙන ඇත.

වර්තමානයේදී පහත දැක්වෙන පුහුණු වැඩසටහන් **OTC** හිදී පැවැත්වේ.

1. මූලික පුහුණුව

   1.1 මූලික ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම

2 බහු-කුසලතා ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු
(සපිරි යන්ත්‍ර නියාමක – සයනි)

ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන්ට එවැනි උපකරණ වර්ග 10කට වඩා ක්‍රියා කරවීමේ කුසලතාවය ලබා දීම සඳහා විශේෂයෙන් සපිරි යන්ත්‍ර නියාමක (සයනි) නිර්මාණය කර ඇත. මෙය කර්මාන්තයේ බහු-කුලසතා සහිත ක්‍රියාකරුවන්ගේ ඉල්ලුම සපුරාලීම සඳහා නවීන ඉගෙනුම් ක්‍රම සමඟ අලුතින් නිර්මාණය කරන ලද වැඩසටහනකි. ඉදිකිරීම් ස්ථාන සහ අනුරූප සේවාවන්හි අඩු පොදු කාර්ය වියදමක් සමඟින් ඉහළ නිමැවුමක් අපේක්ෂා කෙරේ. මෙය 100% නොමිලේ පවත්වන, රජයේ අරමුදල් සපයන වැඩසටහනක් වන අතර එමඟින් වාර්ෂිකව බහු-කුසලතා සහිත ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් 1000ක් දක්වා පුහුණු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. නියමු වැඩසටහන 2021 වර්ෂයේදී ක්‍රියාකරුවන් 42 දෙනෙකුගේ ප්‍රතිදානයකින් සාර්ථකව නිම කරන ලද අතර ඉදිරි වර්ෂයේදී ඉලක්කගත ප්‍රතිදානය සාක්ෂාත් කර ගැනීමට සැලසුම් කර ඇත.

3 කුසලතා සංවර්ධනය

   3.1 සැහැල්ලු ඉදිකිරීම් උපකරණ
   3.2 ඩම්ප් ට්‍රක්
   3.3 ෆාම් ට්‍රැක්ටර්
   3.4 සෙල්ෆ් ප්‍රොපෙල්ඩ් වයිබ්‍රේටින් රෝලර්

3.5 ක්‍රෝලර් ට්‍රැක්ටර්
3.6 වීල් ලෝඩර්
3.7 මෝටර් ග්‍රේඩර්
3.8 හයිඩ්‍රොලික් එක්ස්කැවේටර්
3.9 බැකෝ ලෝඩර්
3.10 ස්කිඩ් ස්ටියර් ලෝඩර්
3.11 මොබයිල් ක්‍රේන්
3.12 ප්ලාන්ට් ට්‍රාන්ස්පෝටර්
3.13 ෆෝක් ලිෆ්ට් ට්‍රක්
3.14 ට්‍රක් මවුන්ටඩ් ක්‍රේන්

3.1 - 3.14 දක්වා සියලුම පුහුණු පාඨමාලා ගාස්තු අය කරන පාඨමාලා වන අතර ඒවායින් සමහරක් සඳහා පාසල් හැර ගිය අය සහ රැකියා විරහිත තරුණ තරුණියන් අතර ඉහළ ඉල්ලුමක් පවතී.

4. වෘත්තීය **පරීක්ෂණ**

4.1 NVQ පරීක්ෂණ

5. **අභිමතකරණය කරන ලද පුහුණු වැඩසටහන්.**

අභිමතකරණය කරන ලද පුහුණු වැඩසටහන් යනු ඔවුන්ගේ අවශ්‍යතා මත සංවිධානවල ඉල්ලීම් අනුව විශේෂයෙන් නිර්මාණය කර ඇති පුහුණු වැඩසටහන් වේ.

6. **ඉදිකිරීම් උපකරණ හා සම්බන්ධිත සේවාවන්**

OTC විසින් කර්මාන්තයේ සංවිධානවල අවශ්‍යතා මත ඉදිකිරීම් උපකරණ ආශ්‍රිත සේවාවන් ලබා දෙයි. 2021 වර්ෂයේදී සිදු කරන ලද ඉල්ලීම මත ඉදිකිරීම් උපකරණ සමූහය නිපුණතාවය සඳහා පරීක්ෂා කරන ලදී

2021 වර්ෂයේ පුහුණු ප්‍රතිදානය

එක් එක් පුහුණු කාණ්ඩ සම්බන්ධයෙන් ක්‍රියාකරු පුහුණු සාක්ෂාත් කර ගැනීම් වගුවේ දක්වා ඇත. (*කරුණාකර 1 වගුව බලන්න*)

1 වගුව: පුහුණු ප්‍රතිදානය 2021

| | පුහුණු වැඩසටහන | ප්‍රතිදානය 2021 | |
|---|---|---|---|
| | | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිවූවන් සංඛ්‍යාව |
| 1.0 | මූලික පුහුණුව | | |
| | 1.1 මූලික ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම | 05 | 131 |
| 2.0 | කුසලතා සංවර්ධනය | | |
| | 2.1 බහු කුසලතා ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් ("සපිරි යන්ත්‍ර නියාමක") | 01 | 42 |
| | 2.2 උසස් පෙළ වෘත්තීය පුහුණු වැඩසටහන (වර්ෂ 13ක අධ්‍යාපනය) | 01 | 36 |
| | 2.3 පුනරුත්ථාපනය වන්නන් බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුවන් ලෙස පුහුණු කිරීම | 02 | 60 |
| | 2.4 ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් | 10 | 52 |
| | එකතුව | **19** | **321** |

## පුහුණු යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

තාක්ෂණය දියුණු වනවිට, නව ඉදිකිරීම් උපකරණ ද උසස් පාලන පද්ධති සහ වැඩි ක්‍රියාකාරිත්වය සමඟ නිෂ්පාදනය කරනු ලැබේ. ක්‍රියාකරුවන්ට එම නවීන උපකරණ පිළිබඳ දැනුම සහ කුසලතා අවශ්‍ය වේ. එබැවින් OTC විසින් එහි ඉදිකිරීම් උපකරණ සමූහය නවීන තාක්ෂණය යාවත්කාලීන කරයි. එහි දිගුකාලීන සංවර්ධන ව්‍යාපෘතියේ පියවරක් ලෙස උසස් පාලන පද්ධති සහිත බැකෝ ලෝඩරයක් 2021 වර්ෂයේදී උපකරණ සමූහයට එක් කරන ලදී.

## ඉදිකිරීම් උපකරණ කුලියට ගැනීම

ඉදිකිරීම් උපකරණ කුලියට ගැනීම ක්‍රියාකරු පුහුණු විද්‍යාල විසින් සපයනු ලබන අතිරේක සේවාවකි. එය විද්‍යාලයට වැඩි ආදායමක් ද උපදවයි. පවතින යන්ත්‍ර සමූහය පුහුණු අවශ්‍යතාවයන් සඳහා ප්‍රමුඛව භාවිතා කරනු ලබන අතර භාවිතට නොගන්නා යන්ත්‍ර පවතින විට ඒවා කුලියට දෙනු ලැබේ.

ඉදිකිරීම් උපකරණ නඩත්තු ඒකකය

ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශයේ ඉදිකිරීම් උපකරණ නඩත්තු සහ කළමනාකරණ පුහුණු ඒකකය, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC), බත්තරමුල්ල, පැලවත්ත, ඩී.පී. විජේසිංහ මාවත අංක 17, යන ස්ථානයේ පිහිටා ඇත. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) අලුත්වැඩියා නඩත්තු හා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා මනාව සකස් කරන ලද ස්ථානයකි. ව්‍යාපෘති සහ නඩත්තු කළමණාකරුවන්, යාන්ත්‍රික ඉංජිනේරුවන්, වැඩපොළ අධිකාරීවරුන්, වැඩපොළ අධීක්ෂකයින්, ජ්‍යෙෂ්ඨ කාර්මිකයින්, යන්ත්‍ර උදවකරුවන් සහ පාසල් හැර යන්නන් සඳහා පුහුණු පාඨමාලා මෙම CETRAC මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබේ.

<u>CETRAC පුහුණු වැඩසටහන්</u>

1996 ඔක්තෝබර් සිට 2001 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළදී ජපන් විශේෂඥයින්ගේ සහාය ඇතිව ඉදිකිරීම් උපකරණ නඩත්තුව සඳහා CETRAC ආරම්භක පුහුණු වැඩසටහන් සකස් කරන ලදී. CETRAC විසින් මූලිකව ඉදිකිරීම් උපකරණ නඩත්තුව හා කළමනාකරණය පිළිබඳ පුහුණුව ලබා දෙයි. CIDA විසින් CETRAC හි ගොඩනැගිලි සේවා ඉංජිනේරු පුහුණු වැඩසටහන් පැවැත්වීම ද ආරම්භ කර ඇත.

2.0 <u>කර්මාන්තයට පිවිසෙන නවකයන් සඳහා පාඨමාලා</u>

යෞවුන් විරැකියාව පිළිබඳ ගැටලුව නිරාකරණය කිරීම සඳහා මුල් පාසල් හැර ගිය අයවලුන් සඳහා වෘත්තීය පාඨමාලා වැඩි වශයෙන් සංවර්ධනය කිරීමට හා පැවැත්වීමට තීරණය කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේදී පහත සඳහන් පාඨමාලා පවත්වන ලදී.

3.0 <u>ඉදිකිරීම් උපකරණ කාර්මික පාඨමාලාව</u>

ඉදිකිරීම් උපකරණ කාර්මික පුහුණු පාඨමාලාව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ සහයෝගීත්වයෙන් පවත්වනු ලැබේ. එය වර්ෂ 02 ක පාඨමාලාවක් වන අතර එය CETRAC හි මාස 12 ක ආයතනික පුහුණුවකින් සහ කර්මාන්තයේ මාස 12 ක රැකියාස්ථ පුහුණුවකින් සමන්විත වේ. අ.පො.ස. (සා/පෙළ) සමත් පාසල් හැර යන්නන් මෙම පුහුණු පාඨමාලාව සඳහා සුදුසුකම් ලබයි. මෙම පුහුණු පාඨමාලාවෙන් නව ඉදිකිරීම් උපකරණ පිළිබඳ සියලුම අලුත්වැඩියා හා නඩත්තු අංශ ආවරණය කෙරේ. වාර්ෂික බඳවාගැනීම පුහුණුවන්නන් 120 කි.

පුහුණුවන කාල පරිච්ඡේදය තුලදී නොමිලේ නවාතැන්, පාඨමාලා ද්‍රව්‍ය, වැඩමුළු පහසුකම්, නිල ඇඳුම්, සහන මිලට ආහාර සහ ආරක්ෂිත ආම්පන්න ආදිය මෙම පුහුණුවන්නන්ට ලබාදෙනු ලැබේ. මෙම වැඩසටහනේ යටතේ පුහුණුව ලැබූ අභ්‍යාසලාභීන් සියලු දෙනාම පාහේ දේශීයව මෙන්ම විදේශයන්හිද ඉහළ ප්‍රතිලාභ ලබමින් සේවය කරනු ලැබේ. ඔවුන්ගෙන් සමහරක් ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සඳහා තමන්ගේම වැඩපොළවල් පිහිටුවා ඇත.

මෙම වැඩසටහන සාර්ථකව නිමකළ අභ්‍යාසලාභීන්ට NVQ- 4 මට්ටමේ සහතිකය ප්‍රදානය කෙරේ.

## 4.0 සේවක නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා

ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා කළමනාකරණය කිරීමේ යෙදී සිටින කාර්මිකයින්, අධීක්ෂකයින් හා කළමණාකරුවන්ගේ තාක්ෂණික දැනුම යාවත්කාලීන කිරීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා සැලසුම් කර ඇත. එක් එක් අභ්‍යාසලාභියා සඳහා වෙන් වෙන් වශයෙන් අවධානය යොමු කිරීමේ අරමුණින් අභ්‍යාසලාභීන් බඳවාගැනීම එක් කාණ්ඩයකට 12 බැගින් සීමා කර ඇත. මෙම පාඨමාලා හැදෑරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රමාණවත් පළපුරුද්දක් අවශ්‍ය වේ.

### 4.1 කණිෂ්ඨ කාර්මිකයින් සඳහා පුහුණු වැඩසටහන්



ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීමේ වැඩපොළවල සේවයේ යෙදී සිටින කණිෂ්ඨ කාර්මිකයින්ගේ දැනුම හා කුසලතා යාවත්කාලීන කිරීම සඳහා මෙම පුහුණු වැඩසටහන් සැලසුම් කරන ලදී. මෙම පාඨමාලා හැදෑරීම සඳහා වර්ෂ 02 සිට 05 දක්වා පළපුරුද්දක් අවශ්‍ය වේ. සේවායෝජකයින් තම පුහුණු අවශ්‍යතා මත ඔවුන්ගේ කාර්මිකයන් ඕනෑම මොඩියුලයකට එවිය හැකි වන ලෙස මෙම පාඨමාලා විවිධ මොඩියුලවලට බෙදා වෙන් කර ඇත. හයිඩ්‍රොලික්ස් සහ මෙකාට්‍රොනික්ස් වැනි මෙම මොඩියුලවලින් ඇතැම් මොඩියුල සඳහා කර්මාන්තයේ ඉහළ ඉල්ලුමක් පවතී. එබැවින් මෙම මොඩියුල සඳහා සමහර විට අතිරේක පාඨමාලා පැවැත්විය යුතු වේ.

### 4.2 ජ්‍යෙෂ්ඨ කාර්මිකයින් සඳහා පුහුණු වැඩසටහන්



ජ්‍යෙෂ්ඨ කාර්මිකයින්ගේ දැනුම හා කුසලතා යාවත්කාලීන කිරීම සහ වැරදි හඳුනාගැනීම හා නිවැරදි කිරීම පිළිබඳව ඔවුන් පුහුණු කිරීම සඳහා මෙම උසස් පුහුණු වැඩසටහන් සැලසුම් කර ඇත. වර්ෂ 05 කට වඩා පළපුරුද්දක් ඇති කාර්මිකයින් මෙම පාඨමලාව සඳහා සහභාගිවීමට සුදුසුකම් ලබයි. සේවායෝජකයන් ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා අනුව, ඕනෑම තෝරාගත් මොඩියුලයකට තම කාර්මිකයින් යැවීමට හැකිවන පරිදි මෙම පුහුණු පාඨමාලා විවිධ මොඩියුල 6 කින් සමන්විත වේ. හයිඩ්‍රොලික්ස් සහ මෙකාට්‍රොනික්ස් වැනි මෙම මොඩියුල වලින් ඇතැම් මොඩියුල සඳහා කර්මාන්තයේ ඉහළ ඉල්ලුමක් පවතින අතර එබැවින් මෙම මොඩියුල සඳහා සමහර විට අතිරේක පාඨමාලා පැවැත්විය යුතු වේ.

### 4.3 අධීක්ෂකවරුන් සඳහා පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම සඳහා වගකිව යුතු වැඩපොළ අධීක්ෂකවරුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා අධීක්ෂක පුහුණු වැඩසටහන් නිර්මාණය කර ඇත. වර්ෂ 02 ක අදාළ පළපුරුද්ද සහිත අධීක්ෂකවරුන් මෙම පාඨමාලා සඳහා බඳවා ගැනේ.

## 4.4 ඉංජිනේරුවන් / කළමණාකරුවන් සඳහා පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් උපකරණ භාවිතය හා නඩත්තු කිරීම සඳහා සම්බන්ධවන ඉංජිනේරුවන්, වැඩපොළ කළමණාකරුවන් හා ව්‍යාපෘති කළමණාකරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා මෙම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

ඉදිකිරීම් උපකරණ භාවිතය හා නඩත්තු කිරීම පිළිබඳ සිවිල් ඉංජිනේරුවන් හා ව්‍යාපෘති කළමණාකරුවන්ට තාක්ෂණික දැනුම ලබාදීම සඳහා ඉදිකිරීම් උපකරණ භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලාව නිර්මාණය කර ඇත. වසර 02 ක පළපුරුද්දක් තිබෙන ඉංජිනේරුවන් මෙම පාඨමාලාව සඳහා බඳවාගැනීම සිදු කරයි.

ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව, ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු යාන්ත්‍රික ඉංජිනේරුවන්ට සහ ඉදිරිපෙළ කළමණාකරුවන්ට තාක්ෂණික දැනුම ලබාදීම සඳහා නිර්මාණය කර ඇත. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා සහභාගීවන්නන්ට වසර 02 ක පළපුරුද්දක් තිබිය යුතුය.





## 4.5 සහායක කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන්

සාමාන්‍යයෙන් ඉදිකිරීම් කර්මාන්තයේ සේවය කරන ගබඩා/ සැපයුම්/ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ක්‍රමානුකූල පුහුණුවක් සඳහා අවස්ථාවක් නොමැත. මෙය උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානවල සුමට ක්‍රියාකාරීත්වයට බාධාවක් වන විවිධ මෙහෙයුම් ගැටලුවලට තුඩු දී ඇත. මෙම පුහුණු අවශ්‍යතාවය සපුරාලීම සඳහා පුහුණු වැඩසටහන් සකස් කරන ලදී.

## 4.6 ගොඩනැගිලි සේවා ඉංජිනේරු පුහුණු වැඩසටහන්

ගොඩනැගිලි සේවා ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඉංජිනේරුවන් සහ ගෘහ නිර්මාණ ශිල්පීන් සඳහා වැඩසටහන් කිහිපයක් ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ නඩත්තු පුහුණු මධ්‍යස්ථානය CETRAC විසින් පවත්වනු ලැබේ.
වාණිජ ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වන මෙම ගොඩනැගිලි සේවා ආවරණය කිරීම සඳහා පුහුණු පාඨමාලා කිහිපයක් නිර්මාණය කර ඇත. ඒවා ගිනි ආරක්ෂණ පද්ධති, විදුලි පද්ධති, වායු සමීකරණ සහ වාතාශ්‍ර පද්ධති, ජල සම්පාදන පද්ධති හා ජලාපවාහන පද්ධති ආදිය ආවරණය කරයි.

## 4.7 පාරිභෝගිකයන් අරමුණු කරගත් පුහුණු වැඩසටහන්

ලබාගත් අත්දැකීම් සමඟ, රටේ වෙනස්වන ඉල්ලුමට සරිලන පරිදි අභිමතකරණය කරන ලද පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීමෙන් පුහුණුවීම්වල විවිධ සහ විශේෂිත ඉල්ලුම සාර්ථකව සපුරාලීමට ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු නඩත්තු මධ්‍යස්ථානයට (CETRAC) හැකි වී තිබේ.

2021 වර්ෂයේ CETRAC කාර්ය සාධනය පහත පරිදි වේ.

වගුව **1 : 2021** වර්ෂයේ **CETRAC** කාර්ය සාධනය

| | පුහුණු පාඨමාලාව | ලියාපදිංචි කළ | | සමත් වූ | |
|---|---|---|---|---|---|
| | | පාඨමාලා සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
| 01 | පාසල් හැරයන්නන් (මට්ටම 1) ඉදිකිරීම් උපකරණ කාර්මික පාඨමාලාව (CEM) | 2 | 120 | 2 | 85 |
| | පුහුණු පාඨමාලාව | ඉලක්කගත ප්‍රතිදානය | | සත්‍ය ප්‍රතිදානය | |
| | | පාඨමාලා සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
| 02 | කණිෂ්ඨ කාර්මිකයින් (මට්ටම II) | | | | |
| | ඩීසල් එන්ජිම නඩත්තු කිරිම (21M21) | 1 | 15 | -- | -- |
| | හයිඩ්‍රොලික් පද්ධති නඩත්තු කිරිම (21M22) | 1 | 15 | -- | -- |
| | ඉදිකිරීම් උපකරණවල විදුලි පද්ධති නඩත්තු කිරිම (21MT) | 1 | 10 | 1 | 10 |
| | කේන්ද්‍රාපසාරී පොම්පය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම | 1 | 15 | 1 | 13 |
| | ජ්‍යෙෂ්ඨ කාර්මිකයන් (III මට්ටම) | | | | |
| | වාහන විදුලි පද්ධති නඩත්තු කිරිම (21M34) | 1 | 15 | -- | -- |
| | හයිඩ්‍රොලික් සහ මෙකට්‍රොනික් පද්ධති නඩත්තු කිරිම (21M32) | 1 | 15 | -- | -- |
| | ඉංජිනේරුවන් | | | | |
| | ඉදිකිරීම් උපකරණ ව්‍යාපෘති කළමනාකරණය (21CPM) | 1 | 15 | -- | -- |
| | ඉදිකිරීම් උපකරණ නඩත්තු කළමනාකරණය (21CEMM) | 1 | 10 | -- | -- |
| | අධීක්ෂණ | | | | |
| | ඉදිකිරීම් උපකරණ නඩත්තු අධීක්ෂණය - හයිඩ්‍රොලික් සහ සම්ප්‍රේෂණ (21SUP1) | 1 | 15 | -- | -- |
| | ඉදිකිරීම් උපකරණ-එන්ජිම සහ මෙකට්‍රොනික්ස් නඩත්තුව අධීක්ෂණය (21SUP2) | 1 | 10 | -- | -- |
| | ඔක්සි ඇසිටිලීන් ගෑස් වෙල්ඩින් සහ අතින් සිදු කරන මෙටල් ආර්ක් වෙල්ඩින් (21GAW) | 1 | 15 | 1 | 13 |
| 03 | අනුබද්ධ කාර්ය මණ්ඩලය | | | | |
| | සහායක කාර්ය මණ්ඩලය සඳහා ගබඩා තැබීම, සැපයුම් දාමය සහ ගබඩා කළමනාකරණය සඳහා මූලික පාඨමාලාව | 1 | 15 | 1 | 26 |
| | ආයතනයේ සුළු කාර්ය මණ්ඩලය සඳහා රාජකාරි, ආගන්තුක සත්කාර සහ ආචාර ධර්ම සම්බන්ධතා පිළිබඳ එක් දින වැඩමුළුව | 1 | 15 | 1 | 55 |
| | තොග සහ ඉන්වෙන්ටරි කළමනාකරණයේ මූලධර්ම සහ එහි ප්‍රායෝගික භාවිතය | 1 | 20 | 1 | 22 |
| | ඵලදායිතා ක්‍රියාවලිය හරහා වර්තමාන අභියෝගාත්මක කොවිඩ්-19 වසංගත තත්ත්වය තුළ තමා සහ සහායකයන් මෙහෙයවීම | 1 | 15 | 1 | 9 |
| | ආයතනයක තත්ත්ව කළමනාකරණ පද්ධති සංකල්ප භාවිතය | 1 | 25 | -- | -- |
| | ගබඩා තැබීම පිළිබඳ පදනම් පාඨමාලාව | 1 | 20 | -- | -- |
| | ගබඩා තැබීම, සැපයුම් දාමය සහ සැපයුම් කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | 1 | 15 | -- | -- |
| 04 | අභිමතකරණ පාඨමාලා (CET) | | | | |
| | ෆෝක්ලිෆ්ට් ක්‍රියාකරු පුහුණුව (දින 5) | 1 | 10 | 1 | 2 |
| | හයිඩ්‍රොලික් සහ ඉලෙක්ට්‍රෝ හයිඩ්‍රොලික් පාලනය | 1 | 15 | 1 | 17 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ෆෝක්ලිෆ්ට් පිළිබඳ දැනුම්වත් කිරීමේ පුහුණු වැඩසටහන (දින 2) | 1 | 15 | 1 | 2 |
| | ජංගම දොඹකරය ක්‍රියාකරවීම | 1 | 18 | -- | -- |
| | ෆෝක්ලිෆ්ට් ට්‍රක් මෙහෙයුම | 1 | 20 | -- | -- |
| | ජනකයන්ත්‍ර සහ මෝටර් | 1 | 30 | -- | -- |
| | බර වාහන නඩත්තුව | 1 | 20 | -- | -- |
| | ෆෝක්ලිෆ්ට් ට්‍රක් රථ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන | 1 | 20 | -- | -- |
| 05 | **අභිමතකරණ පාඨමාලා (BSE)** | | | | |
| | ගොඩනැගිලි ස්වයංක්‍රීය පද්ධති | 1 | 30 | 1 | 12 |
| | විදුලි සෝපාන සහ එස්කැලේටර් නඩත්තු කිරීම | 1 | 30 | 1 | 15 |
| | ගොඩනැගිලි විදුලි පද්ධතිය සැලසුම් කිරීම | 1 | 35 | 1 | 39 |
| | උස් ගොඩනැගිලි සඳහා ජලනල පද්ධති | 1 | 30 | 1 | 34 |
| | ගොඩනැගිලි සහ නිවාස සඳහා පිරිවැය ඵලදායී CCTV පද්ධති සැලසුම් කිරීම | 1 | 25 | 1 | 30 |
| | වැසි ජලය එක්රැස් කිරීම | 1 | 25 | 1 | 34 |
| | හරිත ගොඩනැගිලි හැඳින්වීම | 1 | 25 | 1 | 20 |
| | විදුලි පද්ධතිය සැලසුම් කිරීම පිළිබඳ හැඳින්වීම | 1 | 15 | 1 | 50 |
| | ගොඩනැගිලි සඳහා AC පද්ධති සහ යෙදුම් | 1 | 15 | 1 | 26 |
| | LP ගෑස් සවිකිරීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන | 1 | 15 | 1 | 13 |
| | ද්වාර ප්‍රවේශ පාලන පද්ධති | 1 | 15 | 1 | 27 |
| 06 | **වැඩමුළුව සහ සම්මන්ත්‍රණ** | | | | |
| | වාහන හානි සඳහා තාක්ෂණික ඇස්තමේන්තු | 1 | 100 | 1 | 28 |
| | ආරක්ෂිත, විද්‍යාත්මක සහ සකසුරුවම් රිය පැදවීම | 1 | 50 | 1 | 6 |
| | ඉදිකිරීම් උපකරණ නඩත්තු කළමනාකරණය | 1 | 100 | 1 | 37 |
| | මාර්ග නිවැරදි පිළිවෙත් සැලසුම් කිරීම, ඉදිකිරීම සහ නඩත්තු කිරීම | 1 | 100 | 1 | 78 |
| | ඉදිකිරීම් උපකරණවල උපරිම කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීම | 1 | 100 | 1 | 46 |
| | ඉදිකිරීම් වැඩබිම් ගබඩා කළමනාකරණය | 1 | 100 | 1 | 44 |
| | ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණයේ මූලික පොදු ගැටලු සහ විසඳුම් | 1 | 100 | 1 | 47 |
| | ගොඩනැගිලි නියාමනය සහ අනාගත ගොඩනැගීමේ ප්‍රමිත පිළිබඳ උපදේශනය | 1 | 100 | 1 | 43 |
| | **එකතුව** | **41** | **1433** | **29** | **798** |

2021 වර්ෂය තුළ උපයන ලද ආදායම

| ඒකීය කාණ්ඩය | ආදායම (රු.මිලියන) |
|---|---|
| පුහුණු වැඩසටහන් වැඩ මුළු හා සම්මන්ත්‍රණ | 5.80 |
| වැඩපොළ අලුත්වැඩියා කිරීමේ කාර්යයන් සහ වෙනත් වැඩපොළ සේවා | 4.13 |
| පහසුකම් කුලියට දීම | 1.35 |
| එකතුව | 11.28 |

## 2.6 කර්මාන්ත පුහුණු අංශය

පෙර නොවූ විරූ හා අසමසම වර්ධන වේගයක් වාර්තා කරමින් සිටින ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධන වේගය පවත්වා ගැනීම සඳහා පුහුණු මානව සම්පත් ඇති බව සහතික කරමින් ඉදිකිරීම් කර්මාන්තයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ හැකියාවන් ගොඩනැගීම සඳහා කර්මාන්ත පුහුණු අංශය කැපවී සිටී.

ඉදිකිරීම් කර්මාන්තය වර්තමානය වන විට පුහුණු ශ්‍රමික හිඟයක් අත්විඳිමින් සිටින අතර මෙම නැගී එන දැවැන්ත වර්ධනය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරයි.

ඉදිකිරීම් කර්මාන්තයේ ශ්‍රම බලකා ධාරිතා වර්ධනය කිරීමේ ප්‍රධාන නියෝජිතයා වන පුහුණු අංශය කර්මාන්තයේ මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා කැප වී සිටී.

### 2021 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන්

---

❖ ඉදිකිරීම් අංශයේ නිපුණතා සංවර්ධනය

( ඉදිකිරීම් ශිල්පී පුහුණු වැඩසටහන "ශ්‍රම සිකුරු")

පෙදරේරු, වඩු කාර්මිකයන්, ජලනල කාර්මිකයන්, ටයිල් අතුරන්නන් යනාදී ශිල්පීන්ගේ විශාල හිඟයක් පවතින අතර ඉදිකිරීම් ව්‍යාපෘති නියමිත කාල රාමු තුළ උසස් තත්ත්වයේ ප්‍රමිතීන් පවත්වා ගනිමින් නිසි ලෙස නිම කිරීම සඳහා එය අහිතකර ලෙස බලපායි



ඉදිකිරීම් කර්මාන්තය වර්තමානයේ මුහුණ දෙන මෙම තත්ත්වය, කෙටිම කාලසීමාවක් තුළ වර්තමාන හිඟය සපුරාලීම සඳහා කෙටි පුහුණු වැඩසටහන් වල අවශ්‍යතාවය තවදුරටත් තහවුරු කරයි.

ඉදිකිරීම් කර්මාන්තයේ මෙම ගැටලුව විසඳීම සඳහා NAITA,NCASL හා MCASL සමඟ සහයෝගීත්වයෙන් "ශ්‍රම සිකුරු" කෙටි කාලීන ද්විපාර්ශ්ව පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් CIDA විසින් ඉදිකිරීම් කර්මාන්තයේ ඉහළම ආයතනය වශයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

ඉහත කී වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි පෙදරේරු, වඩු කර්මාන්තය, ටයිල් කිරීම, බාර් බැඳීම සහ ජලනල වැඩ යනාදී කර්මාන්තවල 4000 ක පමණ ශිල්පීන් සංඛ්‍යාවක පුහුණු කර ඇත. පුහුණුවන්නන් අභිප්‍රේරණය කිරීම සඳහා පාඨමාලා ද්‍රව්‍ය, පුහුණුවීම් කාලය තුළ ඔවුන්ගේ දෛනික වියදම් පියවා ගැනීමට මසකට රු. 10,000 බැගින් මාස 3 ක කාලයක් සඳහා දීමනාවක් සහ ඔවුන්ගේ වෘත්තීය කාණ්ඩයට අදාළ මෙවලම් කට්ටල, ආරක්ෂක ආම්පන්න මෙන්ම සුදුසු ඇඳුම් පැළඳුම් ද ලබාදෙන ලදී.

❖ ඉදිකිරීම් ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ ශිල්පී හැඳුනුම්පත් නිකුත් කිරීම

2014 අංක 33 CID පනතට අනුව, හඳුනාගත් ඉදිකිරීම් ව්‍යාපෘතිවල නියැලී සිටින සියලුම ඉදිකිරීම් ශිල්පීන් CIDA හි ලියාපදිංචි වී ශිල්පී හැඳුනුම්පතක් ලබාගෙන තිබිය යුතුය. ඔවුන්ගේ කුසලතා මට්ටම වර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සහ ඉදිකිරීම් කර්මාන්තය තුළ ඔවුන්ට නිසි පිළිගැනීම ලබා දීම සඳහා "පුහුණු පුද්ගලයින්" ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ඇත. පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් යටතේ ලියාපදිංචිය සිදු කෙරේ.

I. පුහුණු ඉදිකිරීම් ශිල්පීන්
II. ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂකවරුන්, මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරීන් සහ ඉදිකිරීම් කර්මාන්තයේ අනෙකුත් වෘත්තිකයන්

මතු සඳහන් ශිල්ප කාණ්ඩ 11 යටතේ එනම් ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු), විදුලි කාර්මික, දැව ශිල්පී (ගොඩනැගිලි), ජලනල ශිල්පී, දැව ශිල්පී (ලී බඩු), යකඩ නවන්නන්, ටයිල් අතුරන්නන්, වෙල්ඩින්කරුවන්, පින්තාරුකරුවන් (ගොඩනැගිලි), ඇලුමිනියම් ෆැබ්රිකේටර් සහ වෙනත් මතුවන ශිල්පීන්, හඳුනාගත් පුහුණු ඉදිකිරීම් ශිල්පීන්ට ශිල්පී හැඳුනුම්පත් නිකුත් කෙරේ. ශිල්පී සහ ප්‍රධාන ශිල්පී ලෙස ප්‍රධාන ශ්‍රේණි දෙකකට කාඩ්පත් නිකුත් කෙරේ. මෙම ලියාපදිංචිය සඳහා සහ ශිල්පී හැඳුනුම්පත ලබා ගැනීම සඳහා මේ වනවිට අයදුම්පත් 18,000 කට වැඩි ප්‍රමාණයක් ලැබී ඇත.

අදාළ රෙගුලාසි දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති අතර නීති රීති සකස් කර අවසන් කිරීම මේ වනවිට සිදු වෙමින් පවතී. අදාළ නීති රීති ප්‍රකාශයට පත් කළ වහාම ශිල්පීන්ගේ නිල ලියාපදිංචිය ආරම්භ කරනු ලැබේ.

## 2.7 නිවාස සැලසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානය





නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය (CHPB) යනු ISO 9001: 2015 සහතිකලත් ආයතනය, තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අංක POI / 054 දරන CIDA කළමනාකරණ යටතට එන බහු-විෂය ආයතනයකි. මෙම ආයතනය බත්තරමුල්ල, පැලවත්ත, පාර්ලිමේන්තු පාර, අංක 33 හි ස්ථානයේ පිහිටා ඇත. තාක්‍ෂණවේදීන්ගේ සහ වෘත්තිකයන්ගේ වෘත්තිය සංවර්ධනය අරමුණු කරගත් පාඨමාලා පැවැත්වීම නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය (CHPB) විසින් අවධාරණය කෙරේ. මෙම තාක්ෂණික සැසි සඳහා ලැබෙන අතිමහත් ප්‍රතිචාරය, වඩා වටිනා පාඨමාලා පැවැත්වීමේ දී නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයෙහි (CHPB) වෘත්තීයභාවය පිළිබඳ සාක්ෂියකි.

❖ නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේ (CHPB) පුහුණු පාඨමාලා

ඉදිකිරීම් හා ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයන් සඳහා හිදැස් පිරවීමේ පුහුණු වැඩසටහන් CHPB විසින් සපයයි. අපගේ ප්‍රධාන ඉලක්ක කණ්ඩායමට, ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳ කැමැත්තක් දක්වන විධායක නිලධාරීන්, ඉංජිනේරුවන්, උනන්දුවන්නන්, ඉදිකිරීම් කළමනාකරුවන් සහ පාසල් හැරයන්නන් ඇතුළත් වේ.

අධීක්ෂකයින් ලෙස භූ දර්ශන ක්ෂේත්‍රයට අවතීර්ණ වීමට කැමත්තක් දක්වන පාසල් හැරගිය අය සහ තරුණ උද්යෝගීන් සඳහා භූ දර්ශන සංවර්ධන සහකාර (NVQ 4) පාඨමාලාව නිර්මාණය කර ඇත.

අභ්‍යන්තර නිර්මාණ වැඩසටහන් කාණ්ඩ දෙකක් යටතේ එනම්, පාසල් හැර ගිය අය සඳහා අභ්‍යන්තර අලංකරණ ශිල්පි (NVQ 4) සහ ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර නිර්මාණ ක්ෂේත්‍රයේ සේවයේ නියුතු වන්නන් ඉලක්ක කරමින් අභ්‍යන්තර සැලසුම් ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනු ලැබේ.



ප්‍රමාණ සමීක්ෂණ වැඩසටහන් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පාඨමාලා සහ ඩිප්ලෝමා පාඨමාලා යන කාණ්ඩ දෙක යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලා ඉදිකිරීම් වැඩ අධීක්ෂකයින්, තාක්ෂණ නිලධාරීන්, සහකාර ප්‍රමාණ පරීක්ෂකයන් සහ සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන්නන් සඳහා ඉලක්ක කෙරේ. ප්‍රමාණ සමීක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව (NVQ 4) හා ප්‍රමාණ සමීක්ෂණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5) ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) විෂය මාලාව මත පදනම්ව ව්‍යුහගත කර ඇත.

ඉහත වැඩසටහන් 2021 වර්ෂය තුළදී පවත්වන ලදී. ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ නියුතුවූවන්ගේ දැනුම සහ කුසලතාව වැඩිදියුණු කිරීම සඳහා මෙම පාඨමාලා සැලසුම් කර ඇත.

❖ ඉදිකිරීම් කර්මාන්තයට අදාළ පරිගණක පාඨමාලා

ඉදිකිරීම් කර්මාන්තයට අදාළ පරිගණක පාඨමාලා වර්ග 03ක් 2021 වර්ෂයේදී පවත්වන ලදී.

- 17 දෙනෙකුගේ සහභාගිත්වයෙන් MS ප්‍රොජෙක්ට් පාඨමාලාව පිළිබඳ වැඩසටහන් එකක් පැවැත්වීම
- 13 දෙනෙකුගේ සහභාගිත්වයෙන් Auto Cad පාඨමාලා පිළිබඳ වැඩසටහන් එකක් පැවැත්වීම

2021 වර්ෂය සඳහා **CHPB** විසින් පහතින් සඳහන් කර ඇති කෙටි කාලීන පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රය සඳහා **MEP** ප්‍රමාණ සමීක්ෂණ - 22 දෙනෙකුගේ සහභාගිත්වයෙන් වැඩසටහන් එකක් පැවැත්වීම
- ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රය සඳහා **Bar schedule** සකස් කිරීම - 26 දෙනෙකුගේ සහභාගිත්වයෙන් වැඩසටහන් එකක් පැවැත්වීම

දේශීය හා විදේශීය ව්‍යාපෘතිවල වැඩ කරන ඉදිකිරීම් කර්මාන්තයේ යෙදී සිටින ඉංජිනේරුවන්, ව්‍යාපෘති කළමනාකරුවන් සහ සැලසුම්කරුවන් සඳහා එය සහයක් වනු ඇත.

**සේවකයින්ගේ නිපුණතා උසස් කිරීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා**

ඉදිකිරීම් කම්කරුවන්, අධීක්ෂකයින්, තාක්ෂණ නිලධාරීන්, ඉංජිනේරුවන්, විධායක නිලධාරීන් හා ව්‍යවසායකයින්ගේ නිපුණතාවය වැඩි දියුණු කිරීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා නිර්මාණය කර ඇත. මෙම පාඨමාලා හැදෑරීම සඳහා කර්මාන්තයේ පළපුරුද්ද සහ අදාළ සුදුසුකම් අත්‍යවශ්‍ය වේ.

❖ **අභිමතකරණය කරන ලද පුහුණු වැඩසටහන් / කෙටි කාලීන පුහුණු පාඨමාලා**

ඉදිකිරීම් කටයුතුවල නියැලී සිටින රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවලින් ලැබෙන විශේෂිත පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය පරිදි සකස් කළ පුහුණු වැඩසටහන් සාර්ථකව සැලසුම් කිරීමට හා ලබා දීමට නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයට (CHPB) හැකි වී තිබේ.

- ව්‍යුහාත්මක නිර්මාණය සමඟ **Bar schedule** සකස් කිරීම - ඌව පළාත් සභාව (සහභාගිවන්නන් 30 ක් සමඟ)
- මිල උච්චාවචන සූත්‍රය - ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඌව පළාත් සභාව (සහභාගිවන්නන් 20 ක් සමඟ)
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය සමඟ ප්‍රමාණ බිල්පත්‍ර සකස් කිරීම - බන්ධනාගාර දෙපාර්තමේන්තුව (සහභාගිවන්නන් 39 ක් සමඟ)
- විදුලි තාක්ෂණ (නේවාසික) – ඉන්ටෙල් සොලූෂන්ස් ලංකා (පෞද්.) සමාගම - (සහභාගීවන්නන් 20 ක් සමඟ)

**සම්මන්ත්‍රණ හා වැඩමුළු**



ඉදිකිරීම් කර්මාන්තය පුරා පැතිරී ඇති විවිධ රැකියා කාණ්ඩවල යෙදී සිටින සේවකයන් සඳහා විවිධ මාතෘකා පිළිබඳ දැනුම හා ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමට සම්මන්ත්‍රණ හා වැඩමුළු සංවිධානය කර ඇත. දේශන, නිරූපණ, ප්‍රායෝගික පරීක්ෂණ, සාකච්ඡා සහ ප්‍රශ්න හා පිළිතුරු සැසි පැවැත්වීමෙන් දැනුම හුවමාරු කිරීම සිදු කෙරේ.

2020 වර්ෂය සඳහා 1063 දෙනෙකුගේ සහභාගිත්වයෙන් CHPB විසින් සම්මන්ත්‍රණ සහ වැඩමුළු 13 ක් පවත්වන ලදී.

CHPB හි ආදායම මත කොවිඩ් - 19 තත්ත්වයේ බලපෑම අවම කිරීම සඳහා නව ක්‍රමවේදයක් ලෙස අප විසින් මාර්ගගත සම්මන්ත්‍රණ පවත්වන ලදි. එම සම්මන්ත්‍රණ පහත දැක්වේ.

- සහභාගිවන්නන් **11** සමඟ ඉදිකිරීම් සඳහා ද්‍රව්‍ය, දේපල සහ පරීක්ෂණ අවශ්‍යතා පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **13** දෙනෙකු සමඟ රිගින් ස්ලිගින් කිරීම සහ සංඥා කිරීම පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **23** දෙනෙකු සමඟ මාර්ගගත වැඩසටහන (පිරිවැය ඵලදායී නිවාස ඉදිකිරීම).
- සහභාගිවන්නන් **12** දෙනෙකු සමඟ විදුලිය පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **38** දෙනෙකු සමඟ ඉදිකිරීම් වැඩබිම්වල ආරක්ෂාව පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **28** දෙනෙකු සමඟ ඵලදායී කොන්ත්‍රාත් පරිපාලනය සඳහා අවශ්‍යතාවය පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **54** දෙනෙකු සමඟ ටෙන්ඩර්/ලංසු ලේඛනය සකස් කිරීම පිළිබඳ ඔන්ලයින් සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **45** දෙනෙකු සමඟ ඵලදායී ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පරිපාලනය සඳහා ප්‍රසම්පාදන අවශ්‍යතා පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **68** දෙනෙකු සමඟ ඉදිකිරීම් සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **18** දෙනෙකු සමඟ අකුණු ආරක්ෂණය පිළිබඳ හැඳින්වීම පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **49** දෙනෙකු සමඟ නීතිය සහ ආරවුල් විසඳීම පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **28** දෙනෙකු සමඟ ඉදිකිරීම් ප්‍රමාදයන් පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.

- සහභාගිවන්නන් **20** දෙනෙකු සමඟ උස් ගොඩනැගිලිවල බලශක්ති කළමනාකරණය පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **6** දෙනෙකු සමඟ විදුලි තාක්ෂණය පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **11** දෙනෙකු සමඟ ව්‍යාපෘති සැලසුම්කරණයේ ජාල විශ්ලේෂණය පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **74** දෙනෙකු සමඟ ඉදිකිරීම් කොන්ත්‍රාත් පරිපාලනයේ ප්‍රමාදයන්, ගැටලු සහ බාධාවන් වළක්වා ගැනීම සඳහා සම්මත ලංසු ලේඛනවල, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, **2006** අත්පොත්හි යෝග්‍යතාව පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **24** දෙනෙකු සමඟ පාර්ශවයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් හි කොන්ත්‍රාත් කළමනාකරණ පාරිභාෂිත බැඳීම පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **18** දෙනෙකු සමඟ අපජල පිරිපහදුව පිළිබඳ හැඳින්වීම පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.
- සහභාගිවන්නන් **51** දෙනෙකු සමඟ **MEP** මිනුම් සඳහා ප්‍රායෝගික ප්‍රවේශයක් පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය.

2021 **වර්ෂයේ** CHPB **සාරාංශගත ප්‍රගතිය පහත** 01 **වගුවෙන් දැක්වේ.**

වගුව 1 - CHPB ප්‍රගති සාරාංශය

| ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2021 දෙසැම්බර් අවසානය දක්වා ප්‍රගතිය | | | | | | |
| අංශය | වාර්ෂික ඉලක්ක | | ප්‍රගතිය (සමුච්චිත ) | | | |
| | භෞතික | මූල්‍ය (රු.මි.) | භෞතික | % | මූල්‍ය (රු.මි.) | % |
| නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය (CHPB) | 1587 | 22.047 | 1602 | 100.95% | 16.554 | 75.09% |

## 2.8 මානව සම්පත් සහ පරිපාලන අංශය

| 14. | ඉගැන්වීම් කාර්ය මණ්ඩලය සඳහා ගාස්තු හා දීමනා | | 540,200.00 | 1,689,693.00 | 251,026.00 | | | | 2,480,919.00 |
| 15. | උපදේශකයින් සඳහා ගාස්තු හා දීමනා | | 153,440.00 | 408,746.72 | | | | | 562,186.72 |
| 16. | මගී වාහන සඳහා ඉන්ධන තෙල් ධාවන වියදම් | 6,638.00 | 108,424.80 | 195,112.00 | | | | | 310,174.80 |
| 17. | වෙනත් වාහන සඳහා ඉන්ධන තෙල් ධාවන වියදම් | | | | | | | | - |
| 18. | ශාලා ගාස්තු | | 12,000.00 | | | | | | 12,000.00 |
| 19. | උපකරණ කුලියට දීම | 12,500.00 | 3,000.00 | | | | | | 15,500.00 |
| 20. | සෞඛ්‍ය හා සනීපාරක්ෂණ | 1,875.00 | 62,833.50 | 64,833.84 | | | | | 129,542.34 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 21. | නවාතැන් | | 33,725.00 | 118,475.00 | 250.00 | | | | 152,450.00 |
| 22. | විවිධ | 53,154.00 | 1,760.00 | 2,085.00 | | | | | 56,999.00 |
| 23. | කාර්යාල අවශ්‍යතා | | | | | | | | - |
| 24. | වෙනත් දීමනා | 187,040.00 | 333,958.87 | | | | | | 520,998.87 |
| 25. | වෙනත් - පුහුණු | 20,900.00 | 11,400.00 | | | | | | 32,300.00 |
| 26. | අතිකාල හා නිවාඩු දින ගෙවීම් 1 | | | | | | | | - |
| 27. | අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 8,822.00 | 179,727.74 | 562,538.09 | | | | | 751,087.83 |
| 28. | ඡායා පිටපත් වියදම් | | 4,584.00 | 10,620.00 | | | | | 15,204.00 |
| 29. | තැපැල් ගාස්තු | | 5,347.50 | 40,793.00 | | | | | 46,140.50 |
| 30. | මුද්‍රණ, ටයිප් කිරීම හා පරිවර්තන | 12,940.00 | 900.00 | | | | | | 13,840.00 |
| 31. | පුහුණු වැඩසටහන් සඳහා ආහාරපාන | 20,730.00 | 872,269.10 | 1,016,382.00 | | | | | 1,909,381.10 |
| 32. | ආහාරපාන | 29,970.00 | 22,651.00 | 160,578.00 | 11,500.00 | | | | 224,699.00 |
| 33. | කුලී හා කුලී ගාස්තු | | 204,900.00 | 235,150.00 | 25,200.00 | | | | 465,250.00 |
| 34. | ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු | 47,575.00 | | | | | | | 47,575.00 |
| 35. | මගී වාහන අලුත්වැඩියා හා නඩත්තු | | 850.00 | 7,800.00 | | | | | 8,650.00 |
| 36. | වෙනත් වාහන අලුත්වැඩියා හා නඩත්තු | 3,500.00 | | | | | | | 3,500.00 |
| 37. | වැටුප් හා වේතන | | 4,162,973.75 | | | | | | 4,162,973.75 |
| 38. | ශිල්ප සවිය මෙවලම් කට්ටල | | 1,139,796.90 | 5,156,285.95 | | | | | 6,296,082.85 |
| 39. | ලිපිද්‍රව්‍ය | 320.0 | 24,855.00 | 37,201.71 | | | | | 62,376.71 |
| 40. | දුරකථන | | (788.84) | 37,341.38 | | | | | 36,552.54 |
| 41. | පුහුණු ආධාර | | | | | | | | - |
| 42. | පුහුණු ද්‍රව්‍ය | | | | | | 56,390.00 | | 56,390.00 |
| 43. | ගමන වියදම් (දේශීය) | 350.00 | 68,390.00 | 124,981.00 | | | | | 193,721.00 |
| 44. | ගමන් වියදම් (ආදායම් උත්පාදනය) | | | | | | | | - |
| 45. | පුහුණුවන්නන් සඳහා නිල ඇඳුම් | | 1,177,815.00 | 5,692,190.00 | | | | | 6,870,005.00 |
| | එකතුව | 481,014.00 | 21,949,298.92 | 50,876,659.41 | 6,823,656.00 | 250,240.00 | 56,390.00 | - | 80,437,258.33 |

සටහන 23

හාණ්ඩාගාර අග්‍රිමය - ප්‍රාග්ධන - රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්ව ආදර්ශය සහිතව ඉදිකිරීම් කර්මාන්තය සඳහා කුසලතා පුහුණුව

| අංකය | විස්තරය | 2020 | | | | |
|---|---|---|---|---|---|---|
| | | මිලියන 154 වැඩසටහන | මිලියන 300 වැඩසටහන | මිලියන 250 වැඩසටහන | මිලියන 93 වැඩසටහන | මිලියන 500 වැඩසටහන |
| | | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| 1. | ප්‍රචාරණය හා ප්‍රචාරණ ද්‍රව්‍ය | 160.00 | 4,400.00 | - | - | - |
| 2. | ආධුනිකයන්ගේ දෛනික පොත් වියදම | - | - | - | - | - |
| 3. | බැංකු ගාස්තු | - | - | - | - | - |
| 4. | ප්‍රසාද දීමනා ගෙවීම් | - | - | - | - | - |
| 5. | පොත් හා සඟරා | 2,310.00 | - | - | - | - |
| 6. | පුහුණුවන්නන් සඳහා මුදල් දීමනා | 8,310,825.00 | 48,869,825.00 | - | - | - |
| 7. | ජීවනාධාර දීමනා | 780,780.00 | 72,800.00 | - | - | - |
| 8. | දෛනික වියදම් හා නවාතැන් | - | 1,125.00 | - | - | - |
| 9. | සංවර්ධන පිරිවැය | 4,000.00 | - | - | - | - |
| 10. | සේවක අර්ථසාධක අරමුදල | 741,941.56 | 73,651.98 | - | - | - |
| 11. | සේවක භාරකාර අරමුදල | 148,388.30 | 14,730.40 | - | - | - |
| 12. | ප්‍රදර්ශන | - | - | - | - | - |
| 13. | සහාය කාර්ය මණ්ඩලය සඳහා ගාස්තු හා දීමනා | 2,502,160.00 | 3,195,060.00 | 879,360.00 | 1,059,260.00 | 1,189,100.00 |
| 14. | ඉගැන්වීම් කාර්ය මණ්ඩලය සඳහා ගාස්තු හා දීමනා | 724,400.00 | 3,926,782.00 | - | - | - |
| 15. | උපදේශකයින් සඳහා ගාස්තු හා දීමනා | | 64,950.00 | | | |
| 16. | මගී වාහන සඳහා ඉන්ධන තෙල් ධාවන වියදම් | 65,820.00 | 394,274.00 | - | - | - |
| 17. | වෙනත් වාහන සඳහා ඉන්ධන තෙල් ධාවන වියදම් | - | - | - | - | - |
| 18. | ශාලා ගාස්තු | - | - | - | - | - |
| 19. | උපකරණ කුලියට දීම | - | - | - | - | - |
| 20. | සෞඛ්‍ය හා සනීපාරක්ෂණ | 17,816.00 | | | | |
| 21. | නවාතැන් | 43,000.00 | 688,540.00 | - | - | - |
| 22. | විවිධ | 1,000.00 | 3,650.00 | - | - | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 23. | කාර්යාල අවශ්‍යතා | - | - | - | - | - |
| 24. | වෙනත් දීමනා | 300,000.00 | 24,000.00 | - | - | - |
| 25. | වෙනත් - පුහුණු | - | - | - | - | - |
| 26. | අතිකාල හා නිවාඩු දින ගෙවීම් 1 | - | - | - | - | - |
| 27. | අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 122,171.02 | 618,589.92 | - | - | - |
| 28. | ඡායා පිටපත් වියදම් | 37,581.69 | 5,757.00 | - | - | - |
| 29. | තැපැල් ගාස්තු | 164,250.00 | 40,828.00 | - | - | - |
| 30. | මුද්‍රණ, ටයිප් කිරීම හා පරිවර්තන | - | - | - | - | - |
| 31. | පුහුණු වැඩසටහන් සඳහා ආහාරපාන | 438,600.00 | 578,875.00 | - | - | - |
| 32. | ආහාරපාන | 129,941.00 | 619,985.50 | - | - | - |
| 33. | කුලී හා කුලී ගාස්තු | - | 140,286.00 | - | - | - |
| 34. | ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු | - | - | - | - | - |
| 35. | මගී වාහන අලුත්වැඩියා හා නඩත්තු | - | 3,150.00 | - | - | - |
| 36. | වෙනත් වාහන අලුත්වැඩියා හා නඩත්තු | - | - | - | - | - |
| 37. | වැටුප් හා වේතන | 4,165,497.02 | 562,914.25 | - | - | - |
| 38. | ශිල්ප සවිය මෙවලම් කට්ටල | - | 3,920,000.00 | - | - | - |
| 39. | ලිපිද්‍රව්‍ය | 4,515.05 | 275.00 | - | - | - |
| 40. | දුරකථන | 105,258.25 | 49,527.88 | - | - | - |
| 41. | පුහුණු ආධාර | - | - | - | - | - |
| 42. | පුහුණු ද්‍රව්‍ය | 3,537,840.00 | 322,590.00 | - | - | - |
| 43. | ගමන වියදම් (දේශීය) | 53,250.00 | 379,004.20 | - | - | - |
| 44. | ගමන් වියදම් (ආදායම් උත්පාදනය) | - | 900.00 | - | - | - |
| 45. | පුහුණුවන්නන් සඳහා නිල ඇඳුම් | - | - | - | - | - |
| | එකතුව | 22,401,504.89 | 64,576,471.13 | 879,360.00 | 1,059,260.00 | 1,189,100.00 |

සටහන 24 - පුද්ගලික පඩිනඩි

| අංකය | විස්තරය | 2021 | 2020 |
|---|---|---|---|
| | | (රු.) | (රු.) |
| 1. | වැටුප් හා වේතන | 107,010,075.43 | 120,019,584.36 |
| 2. | ජීවනාධාර දීමනා | 21,115,997.25 | 22,899,942.69 |
| 3. | පැමිණීමේ දිරි දීමනා | 9,000,334.29 | 9,779,199.41 |
| 4. | දූවිලි දීමනා | 111,900.00 | 126,100.00 |
| 5. | වැඩ බැලීමේ දීමනා | 1,076,275.50 | 810,619.14 |
| 6. | වෙනත් දීමනා | 7,513,789.62 | 8,324,768.06 |
| 7. | අතිකාල / නිවාඩු දින වැටුප් | 16,540,771.91 | 16,250,037.81 |
| 8. | අතිකාල / නිවාඩු දින වැටුප් (1) | 1,602,953.63 | 1,495,438.69 |
| 9. | වෘත්තිය මඩුල්ල සඳහා සාමාජික දායකත්වය | 75,961.00 | 77,411.00 |
| 10. | ප්‍රසාද දීමනා ගෙවීම් | 3,106,331.50 | 3,366,225.00 |
| 11. | සේවක අර්ථසාධක අරමුදල | 19,160,591.08 | 21,068,959.80 |
| 12. | සේවක භාරකාර අරමුදල | 3,832,118.27 | 4,213,791.90 |
| 13. | පාරිතෝෂික | 6,561,233.50 | 17,208,952.50 |
| | එකතුව | **196,708,332.98** | **225,641,030.36** |

සටහන 25 - ගමන් වියදම

| අංකය | විස්තරය | 2021 | 2020 |
|---|---|---|---|
| | | (රු.) | (රු.) |
| 1. | ගමන් වියදම් - (දේශීය) | 913,495.43 | 1,186,197.56 |
| 2. | ගමන් වියදම් - (ආදායම් ජනනය වන) | 391,065.00 | 573,310.00 |
| 3. | ගමන් වියදම් - (විදේශීය) | | - |
| | එකතුව | **1,304,560.43** | **1,759,507.56** |

සටහන 26 - සැපයුම් සහ අවශ්‍යතා

| අංකය | විස්තරය | 2021 | 2020 |
|---|---|---|---|
| | | (රු.) | (රු.) |
| 1. | ඡායා පිටපත් වියදම් | 5,520,202.03 | 4,264,209.73 |
| 2. | ලිපිද්‍රව්‍ය | 663,275.92 | 370,590.79 |
| 3. | කාර්යාල අවශ්‍යතා | 71,075.06 | 292,692.06 |
| 4. | මුද්‍රණ, යතුරු ලියන හා පරිවර්තන | 564,389.50 | 147,662.81 |
| 5. | පොත් හා වාර සඟරා | 534,225.78 | 375,696.69 |
| 6. | අපහරණ හා විනාශ කිරීම් | - | 239,514.17 |
| 7. | ශ්‍රව්‍ය දෘශ්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 39,283.70 | 7,014.41 |
| | එකතුව | **7,392,451.99** | **5,697,380.66** |

සටහන 27 - නඩත්තු වියදම්

| අංකය | විස්තරය | 2021 | 2020 |
|---|---|---|---|
| | | (රු.) | (රු.) |
| 1. | ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | 926,561.04 | 539,579.51 |
| 2. | ලී බඩු හා කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | 1,830,353.55 | 2,651,589.30 |
| 3. | මගී වාහන අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | 2,569,639.47 | 4,254,529.72 |
| 4. | වෙනත් වාහන අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | 315,510.03 | 343,421.95 |
| 5. | පිරියත, යන්ත්‍ර හා උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | 2,166,893.67 | 2,923,501.38 |
| 6. | මෙවලම් හා උපකරණ ද්‍රව්‍ය අලුත්වැඩියාව | 1,050.00 | 111,774.17 |
| 7. | වෙනත් අලුත් වැඩියා හා නඩත්තු / තොරතුරු තාක්ෂණ, යටිතල පහසුකම් අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | 43,136.20 | 747,477.90 |
| 8. | රක්ෂණ (වාහන) | 2,218,710.04 | 2,839,477.13 |
| | එකතුව | **10,071,854.00** | **14,411,351.06** |

සටහන 28 -ඉන්ධන හා උපයෝගීතා ගෙවීම්

| අංකය | විස්තරය | 2021 | 2020 |
|---|---|---|---|
| | | (රු.) | (රු.) |
| 1. | මගී වාහනවල ඉන්ධන හා ධාවන වියදම් | 6,743,190.22 | 5,734,214.80 |
| 2. | වෙනත් වාහනවල ඉන්ධන හා ධාවන වියදම් | 3,072,600.59 | 755,379.35 |
| 3. | කුලී හා කුලී ගාස්තු | 111,254.46 | 234,686.49 |
| 4. | තැපැල් | 694,669.00 | 1,523,314.61 |
| 5. | දූරකථන ගාස්තු | 2,209,154.65 | 2,815,905.46 |
| 6. | අන්තර්ජාල ගාස්තු | 452,955.70 | 305,412.21 |
| 7. | විදුලි ගාස්තු | 5,305,005.17 | 7,745,250.95 |
| 8. | ජල ගාස්තු | 747,051.41 | 929,900.70 |
| 9. | සෞඛ්‍ය හා සනීපාරක්ෂණ | 4,995,915.48 | 5,628,432.14 |
| 10. | ආරක්ෂක සේවා | 5,933,550.00 | 5,894,822.20 |
| | එකතුව | **30,265,346.68** | **31,567,318.92** |

සටහන 29-පර්යේෂණ, සංවර්ධන හා පුහුණු වියදම්

| අංකය | විස්තරය | 2021 | 2020 |
|---|---|---|---|
| | | (රු.) | (රු.) |
| 1. | අලුත් කිරීමේ ගාස්තු - TVEC | - | 80,981.92 |
| 2. | ශිෂ්‍යත්ව හා පුහුණු - (දේශීය) | 44,400.00 | 61,650.00 |
| 3. | උපදේශකවරුන්ට ගාස්තු හා දීමනා | 209,000.00 | 169,050.00 |
| 4. | ඉගැන්වීමේ කාර්යමණ්ඩලයට ගාස්තු හා දීමනා | 5,495,769.83 | 7,884,820.00 |
| 5. | සහාය කාර්යමණ්ඩලයට ගාස්තු හා දීමනා | | 5,000.00 |
| 6. | සංවර්ධන පිරිවැය | - | 9,000.00 |
| 7. | පුහුණු ද්‍රව්‍ය | 27,647.54 | 27,235.45 |
| 8. | පුහුණු සඳහා ඉන්ධන | 280.00 | 219,669.35 |
| 9. | අත් මෙවලම් හා කුඩා උපකරණ | 16,696.33 | 26,389.68 |
| 10. | පුහුණුවන්නන් සඳහා නිල ඇඳුම් | 1,170,232.81 | 1,288,764.11 |
| 11. | පුහුණු වැඩසටහන් සඳහා ආහාර පාන | 1,777,241.67 | 4,295,125.00 |
| 12. | වෙනත් - පුහුණු | 10,715.00 | 1,500.00 |
| 13. | පුහුණුවන්නන් සඳහා මුදල් දීමනා | 945,250.00 | 1,830,750.00 |
| 14. | උපකරණ කුලියට ගැනීම | 1,500.00 | 47,000.00 |
| 15. | ශාලා ගාස්තු | 166,200.00 | 618,830.00 |
| 16. | වාර්ෂික අලුත් කිරීමේ ගාස්තු -එකෝසොෆ්ට් පැකේජය | 140,772.97 | - |
| 17. | N.V.Q. වියදම් | 9,300.00 | - |
| | එකතුව | **10,015,006.15** | **16,565,765.52** |

සටහන 30- මූල්‍ය පිරිවැය

| අංකය | විස්තරය | 2021 | 2020 |
|---|---|---|---|
| | | (රු.) | (රු.) |
| 1. | බැංකු ගාස්තු | 161,683.00 | 163,290.00 |
| 2. | කල් බදු පොලී - මූල්‍ය කල්බදු | 2,288,033.46 | 3,015,403.83 |
| | එකතුව | **2,449,716.46** | **3,178,693.83** |

සටහන 31 - ක්ෂය

**සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ**

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ 2021 වර්ෂය සඳහා මුළු ක්ෂය වියදම රු.92,191,914.96 කි. වාර්තාකරණ දිනයට තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණවල මූලික පිරිවැය පහත පරිදි වේ:

| | වත්කම් වර්ගය | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|---|
| * | පුස්තකාල පොත්-CETRAC | 911,066.73 | 786,270.00 |
| * | පුස්තකාල පොත් - ප්‍රධාන කාර්යාලය | 1,291,445.48 | 1,216,921.48 |
| * | මෙවලම් හා උපකරණ | 19,592,316.38 | 17,833,504.77 |
| * | ලී බඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ | 73,358,018.17 | 55,651,616.23 |
| * | ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ | 5,960,293.73 | 4,330,649.58 |
| | එකතුව | **101,113,140.49** | **79,818,962.06** |

සටහන 32 - වෙනත් වියදම්

| අංකය | විස්තරය | 2021 | 2020 |
|---|---|---|---|
| | | (රු.) | (රු.) |
| 1. | සේවකයන් සඳහා නිල ඇඳුම් | 1,582,860.15 | 605,366.46 |
| 2. | සේවකයන් සඳහා තේ | 709,000.80 | 1,163,382.50 |
| 3. | සෞඛ්‍ය රක්ෂණ | 2,984,484.79 | 3,167,000.00 |
| 4. | වෙනත් | - | 1,419,179.62 |
| 5. | සුභසාධන | 46,100.00 | 132,000.00 |
| 6. | ප්‍රදර්ශන | 46,172.69 | - |
| 7. | ප්‍රචාරණය හා ප්‍රචාරන ද්‍රව්‍ය | 5,248,022.54 | 1,890,953.35 |
| 8. | ආහාර පාන | 414,602.13 | 865,813.08 |
| 9. | ආසන දීමනා | 2,565,180.00 | 1,415,400.00 |
| 10. | විගණන ගාස්තු | 816,025.00 | 935,167.00 |
| 11. | නෛතික ගාස්තු | 108,140.00 | 74,425.00 |
| 12. | බලපත්‍ර ගාස්තු | 486,391.41 | 379,309.29 |
| 13. | විවිධ වියදම් | 444,629.56 | 53,944.00 |
| 14. | කුලී හා රේට | 499,800.82 | - |
| 15. | කල්බදු ක්‍රමක්ෂය | 32,613.64 | 32,613.64 |
| 16. | තාවකාලික නවාතැන් | 5,302,650.00 | 3,520.00 |
| 17. | අඩමාන ණය ඌන ප්‍රතිපාදනය | - | 712,895.88 |
| 18. | ඉදිකිරීම් විශිෂ්ටත්වය පිළිබඳ වියදම් | - | 228,115.00 |
| 19. | ISO වාර්ෂික ගාස්තු | - | 97,959.20 |
| 20. | සේ.අ.අ. වන්දි | - | 2,695,954.44 |
| 21. | සේ.හා.අ. වන්දි | - | 21,966,287.50 |
| 22. | මෙහෙයුම් කල්බදු | 200,000.00 | 200,000.00 |
| 23. | තාක්ෂණ විගණකවරුන් සඳහා ගාස්තු සහ දීමනා | 123,600.00 | - |
| 24. | අසම්භාව්‍ය වියදම් | 1,956,538.35 | - |
| | එකතුව | **23,566,811.88** | **38,039,285.96** |

සටහන 33

භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන (පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම, ඉදිකිරීම් උපකරණ යාන්ත්‍රික පාඨමාලාව ) සහ ප්‍රාග්ධනය සඳහා අග්‍රිමය - (රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්ව ආදර්ශය වැඩසටහන් සහිත ඉදිකිරීම් කර්මාන්තය සඳහා ශිල්ප පුහුණු) මුදල් අමාත්‍යාංශය මඟින් ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ මූල්‍යයනය කෙරේ. තවද අදාළ වර්ෂයේ ප්‍රාග්ධන වියදම් හා ආදායම සමාන මුදලකට තාර්කික පදනමක් මත අදාළ වර්ෂයේ හඳුනාගනු ලබන අතර එම ආදායම හා වියදම CIDA ගිණුම්කරණ ප්‍රතිපත්ති (ප්‍රාග්ධන ප්‍රදාන) වලට අනුකූලව අදාල වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනම දක්වනු ලැබේ.

සටහන 34 -මුදල් හා බැංකු

අධිකාරියේ ක්ෂණික මුදල් අවශ්‍යතාවයන් මත රඳා පවතින කෙටි කාලීන තැන්පතු විවිධ කාල පරිච්ඡේදයන් සඳහා තැන්පත් කර ඇති අතර අදාල කෙටි කාලීන තැන්පතු රේටයට පොලිය උපයා ගනී. අධිකාරියේ රු. මිලියන 456.15 ක්වූ බැංකු ශේෂය තුල සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදාගත යුතු රු. මිලියන 184.96 ක මුදලක් ඇතුලත් වේ.

සටහන 35 - තොග

තොග පිරිවැය පදනම මත දක්වා ඇත. තොග වලට අමතර කොටස්, නඩත්තු විෂයයන්, පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය, ලිපි ද්‍රව්‍ය හා වෙනත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ආදිය ඇතුලත් වේ. සාමාන්‍ය පිරිවැය ක්‍රමවේදය මත ද්‍රව්‍ය නිකුත් කරන අතර අවසන් තොගය ද සාමාන්‍ය පිරිවැය ක්‍රමවේදය භාවිතයෙන් තක්සේරු කරනු ලැබේ.

සටහන 36- වාර්තාකරණ දිනයට පසු සිදුවීම්

2021 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කරන වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම් කිසිවක් නොමැත.

සටහන 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම්

ඇ.

නෛතික නඩු කටයුතු, නඩුවේ ස්වාභාවය හා තත්ත්වය සමඟ හෙළිදරව් කර ඇත. 2021 දෙසැම්බර් 31 දිනට සඳහන් කළ යුතු පහත සඳහන් නඩු පවතී.

| අංකය | නඩුවේ ඉල්ලුම්කරු | උසාවිය / ආයතනය | පියවර | දායක මුදල (රු.) | අධිභාරය (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|---|
| 1. | CIDA සේවකයන්ගෙන් සමන්විත ජාතික සේවක සංගමය | කම්කරු දෙපාර්තමේන්තුව, කොළඹ | 01.01.2006 සිට 01.06.2011 දක්වා කාලය තුල ICTAD සේවකයන් සඳහා සේ.අ.අ. හිඟ මුදල් | 14,977,525/- | 7,488,762.50 | 22,466,287.50 |
| 2. | ගෘහ නිර්මාණ ශිල්පී. එච්.කේ.බාලචන්ද්‍ර මයා | කම්කරු විනිශ්චය සභාව, කොළඹ. | සේවා අවසන් කිරීම - අත්හදා බැලීමේ අදියර | 1906538.35 | 50,000.00 | 1,956,538.35 |
| 3. | ජී.එන්.එන්. කුමුදු ජයකොඩි මහත්මිය | කම්කරු දෙපාර්තමේන්තුව, කොළඹ | රැකියා කොන්දේසි විමසීම | | | |
| 4. | උපදේශන සමාගම් විසින් රිට් අයදුම්පත | අභියාචනාධිකරණය | උපදේශන සමාගම් ලියාපදිංචි කිරීම - අප විසින් ගොනු කරන ලද මෝසම සලකා බැලීම | | | |
| මුළු එකතුව | | | | | | 24,422,825.85 |

අදාල ගැලපීම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම් ප්‍රකාරව සිදු කර ඇත.

ආ. නාගරික සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ල, පැලවත්තෙහි ඉඩම (1993.11.30 දිනැති අංක 1011 සැලැස්මෙහි කැබලි අංක 1 සහ 1993.11.30 දිනැති අංක 1010 සැලැස්මෙහි කැබලි අංක 1) 99 අවුරුදු කල්බදු ගිවිසුම යටතේ පවතින අතර දෙපාර්ශ්වයම කල්බදු ගිවිසුම ක්‍රියාත්මක කළ යුතුය.

සටහන -38 - කල්බදු

2019 ජනවාරි මාසයේදී පහත සඳහන් වත්කම් මෙහෙයුම් කල්බදු යටතේ ගෙන ඇත. පහත සඳහන් වත්කම් මෙහෙයුම් කල්බදු යටතේ ගෙන ඇත.

| අංකය | වත්කම් වර්ගය | පිරිවැය (රු.) | වාර්තාකරණ දිනයට ක්ෂය සඳහා ප්‍රතිපාදන | ශුද්ධ ධාරණ අගය | කල්බදු කාලය | බදුකරු |
|---|---|---|---|---|---|---|
| 1. | MITSUBISHI - මෝටර් රථය | 11,035,490.00 | 4,138,308.75 | 6,897,181.25 | 05 Years | ලංකා බැංකුව |
| 2. | MITSUBISHI - මෝටර් රථය | 11,035,490.00 | 4,138,308.75 | 6,897,181.25 | 05 Years | ලංකා බැංකුව |
| 3. | MITSUBISHI - මෝටර් රථය | 11,035,490.00 | 4,138,308.75 | 6,897,181.25 | 05 Years | ලංකා බැංකුව |
| | එකතුව | **33,106,470.00** | **12,414,926.25** | **20,691,543.75** | | |

මෙහෙයුම් කල්බදු

පහත සඳහන් වත්කම් මෙහෙයුම් කල්බදු යටතේ ගෙන ඇත.

| අංකය | වත්කම් වර්ගය | පිරිවැය (රු.) | වාර්තාකරණ දිනයට ක්ෂය සඳහා ප්‍රතිපාදන | ශුද්ධ ධාරණ අගය | කල්බදු කාලය | බදුකරු |
|---|---|---|---|---|---|---|
| 1. | වාසභූමි සැලසුම් හා සංවර්ධනය සඳහා මධ්‍යස්ථානය | 2,851,477.20 | 503,295.48 | 2,348,181.72 | වර්ෂ 99 | නාගරික සංවර්ධන අධිකාරිය |
| 2. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය - ප්‍රධාන කාර්යාලය | - | එක් වසරකට 200,000.00 | - | වර්ෂ 30 | ටවර් හෝල් රඟහල පදනම |
| | එකතුව | **2,851,477.20** | **503,295.48** | **2,348,181.72** | | |

**සටහන -39 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ**

**වාර්තාකරණ වර්ෂය සඳහා කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු සලකා බලමින් පවතී.**

**සටහන 40 - වසර 13ක සහතිකලත් NVQ පුහුණු වැඩසටහන**

**" වසර 13ක සහතිකලත් NVQ පුහුණු වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.7,645,440.44 ක් වියදම් කර ඇත. "**

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය: CAE/B/CIDA/FA/2021/11 දිනය : 2022 ජුනි 28

සභාපති
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනත සහ 1971 අංක 8 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව ඉදිරියේදී ඉදිරිපත් කරමි.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2001 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) 9 - තොග :වසර අවසානයේ භෞතික තොග ශේෂ ගණන් කිරීම නිරීක්ෂණය කිරීමට නොහැකි වූ අතර ස්වාධීන තහවුරු කිරීම් නොමැතිවීම හේතුවෙන් 2001 දෙසැම්බර් 31 දිනට රුපියල් 149,490,346ක් වටිනා තොග අයිතමවල භෞතික පැවැත්ම තහවුරු කිරීමට විකල්ප ක්‍රම මගින් සෑහීමකට පත් වීමට නොහැකි විය. මෙම මුදලට අමතර කොටස් සහ මෙවලම්, අලෙවි නොකළ ප්‍රකාශන සහ අනෙකුත් ලිපි ද්‍රව්‍යවල වටිනාකම් ඇතුළත්ව තිබුණි.

මේ අතර, 2012 අගෝස්තු 06 වැනි දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී (COPE) අධිකාරියේ නිලධාරින්ට උපදෙස් දී තිබුණේ අමතර කොටස් සහ මෙවලම් වැනි පුහුණු ද්‍රව්‍ය ප්‍රධාන තොගවලින් වෙන් කර වාර්ෂිකව එම භාණ්ඩ නැවත තක්සේරු කිරීමට කටයුතු කරන ලෙසයි. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 දින වනවිටත් මෙම උපදෙස් පිළිපැදීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. තවද, කමිටුවක් පත් කර එයින් හඳුනාගන්නා ප්‍රයෝජනයට නොගන්නා ද්‍රව්‍ය බැහැර කරන බවට COPE රැස්වීමේදී පොරොන්දු වුවද 2022 මාර්තු 31 වන විටත් අධිකාරිය ඒ අනුව ක්‍රියා කර නොතිබුණි. ඉහත කරුණු අනුව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දක්වා ඇති රු.මිලියන 149ක තොග ශේෂයෙහි නිරවද්‍යතාවය සහ සාධාරණ වටිනාකම පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට නොහැක.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත **(SLPSAS) 7 දේපළ, පිරියත හා උපකරණ** ප්‍රමිතයේ 65 ඡේදය පරිදි පිරිවැය රු.101,113,140 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබුණු අතර මෙම වත්කම්වල ඵලදායී ජීවකාලය හා සාධාරණ වටිනාකම නැවත තක්සේරු කර ගිණුම් ගත කිරීමකින් තොරව අඛණ්ඩව භාවිත කරමින් තිබුණි. තවද SLPSAS 3 - **ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි** ප්‍රමිතය අනුව ඉහත සම්පූර්ණ ක්ෂය වූ වත්කම් වල ප්‍රයෝජනවත් ආයුකාලය වෙනස්වීම් ලෙස සලකා මූල්‍ය පකාශනවල ගැලපීම් සිදු කර නොතිබුණි.

(ඇ) 2021 දෙසැම්බර් 31 දිනට රු. 745,463,465 ක් වටිනා ස්ථාවර වත්කම් නිසි පරිදි කේත කර නොතිබුණි. එමෙන්ම එම වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ඒ අනුව වාර්ෂික වත්කම් සත්‍යාපනය කිරීමට හැකිවන පරිදි එම කේත ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට හා අධිකාරිය විසින් ඉවත් කරන ලද භාණ්ඩ හා අලුතින් මිලදී ගත් භාණ්ඩ දක්වමින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන්ට අනුකූලව තම ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය

(ඈ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවලට අනුව පාරිතෝෂික දීමනා ගෙවීම සඳහා රු. 154,045,468 ක මුදලක් ස්ථාවර තැන්පතු, ඇමතුම් තැන්පතු සහ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර තිබුණි. කෙසේ වුවත් මෙම ආයෝජනය තුළ (රු. මිලියන 50ක ඇමතුම් තැන්පතු ඇතුළුව) වසර 4කට වැඩි කාලයක් නොවෙනස් ව පැවතුණි. තවද, ආයෝජන සඳහා ලැබී තිබුණු පොලී ආදායම රු. මිලියන 7.5ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතය 19 –**"සේවක ප්‍රතිලාභ"**, ප්‍රමිතය ප්‍රකාර පාරිතෝෂික ගෙවීම් ප්‍රතිපාදනවලට බැර නොකර සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පාරිතෝෂික ප්‍රතිපාදන එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පැලවත්ත, බත්තරමුල්ලෙහි එහි පිහිටි ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් වන අතර මේ සඳහා විධිමත් බදු බදු ගිවිසුමකට එළඹීම සඳහා රු. 54,890,701 ක මුදලක් හා මෙම මුදල මත පදනම්ව 7% ක ප්‍රමාද ගාස්තුවක් ලබාදෙන ලෙස 2019 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉල්ලා තිබුණි. මෙම ගැටලුව විසඳීමට අධිකාරිය විසින් විගණන වාර්තාව

නිකුත් කරන දිනය වන විටත් අපොහොසත්ව තිබුණු අතර මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන හෝ හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඊ) වසර දහස් 13ක් සහතිකලත් අඛණ්ඩ අධ්‍යාපන (NVQ) පුහුණු වැඩ වැඩසටහන් පැවැත්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් 2020 සහ 2021 වසර තුළ පිළිවෙලින් රු. 10,000,000ක් රු. 35,844,000 ක් ලැබී තිබුණි. මෙම මුදල් වෙනම අරමුදල් ගිණුමකට බැර කිරීම වෙනුවට 2020 සහ 2021 වසර සඳහා ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. එයින් රු. 13,458,544 ක මුදලක් පමණක් 2021 දෙසැම්බර් 31 දින දක්වා මෙම පුහුණු වැඩසටහන සඳහා වියදම් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු. 32,299,656 කින් රඳවාගත් ලාභය වැඩියෙන් දක්වා තිබුණු අතර ඊට සමාන මුදලකින් 20 21 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් අඩුවෙන් දක්වා තිබුණි. තවද මෙම පුහුණු වැඩසටහනේ ප්‍රගතිය විගණන කටයුතු සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(උ) ලැබී ඇති තොරතුරු වලට අනුව 2021 දෙසැම්බර් 31 දිනට වාහන 56 ක් අධිකාරිය සතුව ඇත. එසේ වුවද 2021 දෙසැම්බර් 31 දින වනවිට වාහන 46ක් සම්බන්ධයෙන් වන පිරිවැය, ක්ෂයවීම් සහ සමුච්චිත ක්ෂයවීම් පමණක් හඳුනාගෙන තිබුණි. තවද මෙම වාහනවල භෞතික පැවැත්ම සහතික කිරීම සඳහා භෞතික සත්‍යාපනය වර්ෂය තුළ හෝ පෙර වර්ෂවලදී සිදු කර නොතිබුණි. එබැවින් ඉතිරි වාහන 10හි වටිනාකම සමාලෝචිත වර්ෂය තුළ දී හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) මුළු වටිනාකම රු. 96,707,441 ක්වූ ඉඩම, පුස්තකාල පොත්, ලැබිය යුතු තොග විකුණුම් ආදායම්, කුලී ආදායම, නිපුණතා සංවර්ධන වැඩසටහන් සඳහා වන වියදම් සහ වාහනවල ඉන්ධන සහ ධාවන වියදම් වැනි ගිණුම් අයිතම හයක් (06) හිමිකම් ඔප්පු, සත්‍යාපන වාර්තා, ආධාරක ලේඛන, කුලී ආදායම් ලේඛනය, තක්සේරු වාර්තා සහ කුලී දී ඇති පාර්ශ්වවල විස්තර, සවිස්තර සැලැස්ම සහ වැඩසටහන්වල ප්‍රගතිය, ඉන්ධන පරිභෝජනය පරීක්ෂණ වාර්තා වැනි සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සහතික කිරීමට නොහැකි විය.

(එ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළ එකතු කළ අගය මත බදු (VAT) ලෙස රු. 13,874,360 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් ප්‍රතිදාන VAT බදු ගණනය කිරීම සඳහා සලකා බලනු ලබන බදු අය කළ හැකි සැපයුම් සහ ආදායම පිළිබඳ සැසඳුම් ප්‍රකාශනයක් අධිකාරිය විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි. එවැනි සැසඳීමක් ලබා නොදී 2021 වර්ෂය තුළ සිදු කරන ලද වැට් බදු ගෙවීම්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය තහවුරු කර ගත නොහැකි විය. තවද 2021 වර්ෂය සඳහා වූ වැට් බදු ප්‍රතිලාභ ද විගණනය සඳහා කැඳවනු ලැබුවද ලබා දී නොතිබුණි.

(ඒ) 2021 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ වත්කම් 5කට අදාළව ස්ථාවර වත්කම් ලේඛනයේ සහ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන සමුච්චිත ක්ෂවීම් අතර රු. 11,470,290 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් එක් එක් ශේෂයන් සැසඳුම් කර මෙම වෙනස නිවැරදි කිරීම සඳහා ක්‍රියා කර නොතිබුණි.

(ඔ) රු. 10,753,391 ක් වූ ණය ගැතියන් 82 දෙනෙකුගෙන් ශේෂ තහවුරු කිරීම් ලිපි කැඳවූ අතර ඊට අදාළව තහවුරු කිරීම් ලැබී තිබුණේ රු.3,652,559 ක් වටිනා ණය ගැතියන් 14 දෙනෙකුගෙන් පමණි. තවද විගණනයට සපයා ඇති වයස් විශ්ලේෂණයට අනුව රු. 3,787,238 ක් වූ ණයගැති ශේෂයන් 2021 දෙසැම්බර් 31 දිනට වසර පහකට වැඩි කාලයක් හිඟව තිබූ අතර මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා මෙම මුදල අය කරගෙන නොතිබුණි. 2020 සහ 2021 වර්ෂවල දී රු. 1,488,531ක ණයගැති ශේෂය නොවෙනස්ව පැවති අතර, ඒ අනුව, ණයගැති ශේෂයන් අයකර ගැනීම සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් පවතින බව විගණනයේ දී තවදුරටත් නිරීක්ෂණය විය.

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව සිදු කළෙමි. එම ප්‍රමිතීන් යටතේ, මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම් කොටසෙහි තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීමට මා ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

### 1.3. අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරුවලට අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු ඇතුළත් නමුත් මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳ මාගේ විගණක වාර්තාව ඇතුළත් නොවේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මා ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනය සම්බන්ධයෙන්, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගෙන ඇති අනෙකුත් තොරතුරු කියවා, එසේ කිරීමේදී, අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන හෝ විගණනයේ දී මා ලබාගත් දැනුම සමඟ ප්‍රමාණාත්මකව නොගැලපේද යන්න හෝ එසේ නොමැති නම් සාවද්‍ය ලෙස ප්‍රකාශ කර තිබේද යන්න සලකා බැලීම වේ.

අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාව කියවීමේදී, එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ ඇති බව මා නිගමනය කරන්නේ නම්, නිවැරදි කිරීම සඳහා පාලනය සම්බන්ධයෙන් වගකීම පැවරී ඇති අයට එම කාරණය සන්නිවේදනය කිරීම මා විසින් සිදු කරනු ලැබේ. තවදුරටත් නිවැරදි නොකළ සාවද්‍ය ප්‍රකාශ තිබේ නම්, ඒවා ඉදිරියේදී සභාගත කරනු ලබන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මාගේ වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට පාලනය සම්බන්ධ වගකීම පැවරී ඇති පාර්ශ්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම, අධිකාරියේ පාලනය සම්බන්ධ වගකීම පැවරී ඇති පාර්ශ්ව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවෙන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැක.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මගේ විගණනයේදී මා හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ කිසියම් සැලකිය යුතු අඩුපාඩුවක් ඇතුළුව, වෙනත් කාරණා අතර, සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන්, පාලනය සම්බන්ධයෙන් වගකීම පැවරී ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි පහත අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ.

2.1.1. විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන ඇති අතර, තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර මාගේ විමර්ශනයෙන් පෙනෙන පරිදි, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) හි අවශ්‍යතාවය අනුව අධිකාරිය විසින් නිසි ගිණුම් වාර්තා තබා ඇත.

2.1.2. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව ඉකුත් වසරට අනුකූල වේ.

2.1.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (l) (ඇ) (iv) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය ඡේදයේ 1.2 (ආ), ඉ, සහ ඊ හි සඳහන් විගණන කරුණු හැර ඉකුත් වර්ෂයේ මා විසින් කරන ලද සියලුම නිර්දේශ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වේ.

2.2. අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබාගත් සාක්ෂි ප්‍රමාණාත්මක කරුණු සඳහා පමණක් සීමා වූ අතර පහත සඳහන් කරුණු සඳහා ප්‍රකාශ කිරීමට කිසිවක් මාගේ අවධානයට ලක්ව නැත;

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව සාමාන්‍ය කටයුතුවලින් බැහැරව අධිකාරිය විසින් ඇති කර ගත් කවර හෝ කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් අධිකාරියේ පාලක මණ්ඩලයේ කවර හෝ සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර සම්බන්ධයක් ඇති බව ප්‍රකාශ කිරීමට;

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව පහත සඳහන් අවස්ථාවල හැර අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද අදාළ නීතිය, පොදු සහ විශේෂ විධාන කිසිවක් හැර අධිකාරිය අනුකූල වී නොමැති බව ප්‍රකාශ කිරීමට;

| *නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව* | *විස්තරය* |
|---|---|
| (අ)1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | 2021 වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම විගණන වාර්තාව නිකුත් කරන දින වනවිටත් මූල්‍ය ප්‍රකාශන සමගින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ II කොටස, 7(1) වගන්තිය | එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය විශාල ලෙස අවප්‍රමාණය වීම, ඉන්ධන හිඟය, ඉදිකිරීම් ද්‍රව්‍යවල විශාල මිල ඉහළ යාම, ඉදිකිරීම් කර්මාන්තය මුහුණ දෙන ද්‍රව්‍ය හිඟය වැනි වර්තමාන ගැටලු විසඳීමට අවශ්‍ය යෝජනා හා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් තීරණ ගැනීම් සඳහා සෑම මාස තුනකට වරක් ජාතික උපදේශන සභාව (NAC) පැවැත්වීම ඉතා වැදගත් වේ. කෙසේ වෙතත් ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට සහ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනයට සහ පැවැත්මට අවශ්‍ය ක්‍රියාමාර්ග යෝජනා කිරීමට සමාලෝචිත වර්ෂයේදී හා ඊට පෙර වසරේ ජාතික උපදේශන සභා රැස්වීම් පවත්වා නොතිබුණි. අධිකාරියේ වර්තමාන් ඉදිකිරීම් දර්ශක මගින් රටේ සැබෑ මිල උච්චාවචනයන් පිළිබඳ නොකරන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. |
| (ඇ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 7(1) (අ), (ආ) සහ (ඇ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් කරන ලෙස 2022 ජනවාරි 11 සහ 2022 මාර්තු 18 යන දිනයන්හිදී දෙවරක් කැඳවා තිබුණද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 571 (2) | වසර දෙකක කාලයක් තුළ ඇති සියලුම තැන්පතු අධිකාරියේ ආදායමට බැර කළ යුතු වුවද, එසේ නොකර, ගෙවිය යුතු රඳවුම් මුදල් සහ ටෙන්ඩර් තැන්පතු වැනි හඳුනා නොගත් සහ කල් ඉකුත් වූ තැන්පතු රු. 2,955,273 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අධිකාරිය විසින් තැන්පතු ලෙස රඳවා ගෙන තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756,757,758,759 සහ 2016 මාර්තු 31 දිනැති අංක | (i) එක් මූල්‍ය වර්ෂයක් අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ජංගම නොවන වත්කම් සහ තොග අයිතමවල භෞතික පැවැත්ම සහතික කිරීම සඳහා වාර්තාකරණ කාල සීමාවට අදාළව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු |

| | |
|---|---|
| 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කළ යුතු වුවද, මෙම භාණ්ඩ සමීක්ෂණය සිදු කර, ඊට අදාළ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.<br>(ii) පසුගිය වර්ෂවල සමීක්ෂණ වාර්තාවල පෙන්වා දුන් අඩුපාඩු සහ අතිරික්තයන් මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වාවත් නිවැරදි කර නොතිබුණි.<br>(iii) පෙර වසර සඳහා විගණනයට ඉදිරිපත් කරන භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව, මුදල් රෙගුලාසි හි දක්වා ඇති ආකෘති පත්‍ර (T &A 66 සහ පොදු 47) භාවිතා කරමින් භාණ්ඩ පරීක්ෂණ නිසි ලෙස පවත්වා නොමැති බව අනාවරණය විය. |
| (ඉ)2020 ජනවාරි 27 දින ඇති අංක PED/01/2020 දරණ මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 06 ඡේදය | එක් එක් සේවාව සඳහා ගත වන කාලයන් සහ ගාස්තු දක්වමින් පුරවැසි ප්‍රඥප්තියක් සකස් කර කාර්යාල පරිශ්‍රවල සහ වෙබ් අඩවිවල මහජනතාවට/පාරිභෝගිකයින්ට ප්‍රදර්ශනය කරන බවට සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වග බලා ගත යුතුය. කෙසේවුවද අධිකාරිය විසින් 2022 මැයි 31 දින වනවිටත් මෙම උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඊ)යහපාලනය සඳහා වූ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දින දිනැති PED/12 පොදු ව්‍යාපාර චක්‍රලේඛය | |
| 4.2.5 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩලය මාසික රැස්වීම්වල සමාලෝචනය සහ සාකච්ඡා සඳහා තොග කාල විශ්ලේෂණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද ගිණුම්කරණ පද්ධතිය තුළින් තොග කාල විශ්ලේෂණ වාර්තාවක් ලබා ගැනීමේ හැකියාවක් අධිකාරියට නොමැත. එබැවින් තොග කාල විශ්ලේෂණය මත පදනම්ව සෙමින් චලනය වන, චලනය නොවන සහ යල් පැන ගිය අයිතම හඳුනාගැනීමට නොහැකි ව පැවතිණි. |
| 6.5.3 ඡේදය | 2019 හා 2020 වර්ෂවල වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| 9.14 ඡේදය | අධිකාරියේ මානව සම්පත් සුමට හා ඵලදායී ලෙස පරිපාලනය සඳහා මානව සම්පත් කළමනාකරණයට අදාළ සියලු කරුණු ඇතුළත් ක්‍රියා ක්‍රියාපටිපාටි අත්පොතක් තිබිය යුතු වුව ද එවැනි අනුමත අත්පොතක් අධිකාරිය සතුව නොතිබුණි. |
| (උ) 2017 ජූනි 28 දින අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය සහ 2020 ජනවාරි 03 දින අංක 01/2017(1) | ඉඩම් සහ ගොඩනැගිලි කුලියට ගත් බදු දේපළ පිළිබඳ පිළිබඳ යාවත්කාලීන තොරතුරු 2021 මාර්තු 15 දිනට හෝ ඊට පෙර පාලක ජනරාල් වරයා වෙත 2022 අප්‍රේල් 30 වන දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (ල) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පහත සඳහන් අවස්ථාවල හැර අධිකාරිය එහි බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීමට,

අධිකාරිය පිහිටුවා වසර හතක් (07) කට වැඩි කාලයක් ගත වී ඇතත් අධිකාරියේ මෙහෙයුම් කටයුතු සුමට හා ඵලදායීව සිදු කිරීම සඳහා 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති පහත සඳහන් කටයුතු අධිකාරිය විසින් මෙතෙක් සිදු කර නොතිබුණි. ඉදිකිරීම් කර්මාන්තයේ භාවිතා වන ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ඉදිකිරීම් උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන්ගේ නාමාවලියක් පවත්වාගෙන යාම, ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ ඔවුන්ට ශිල්පීය හැදුනුම්පත් නිකුත් කිරීම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම, වෙනත් රටවල ඉදිකිරීම් කටයුතු භාර ගනු ලබන දේශීය වශයෙන් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම, ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය, පිරියත සහ යන්ත්‍රෝපකරණ අවශ්‍යතා සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම සහ ඉදිකිරීම් කටයුතුවලදී දේශීය නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ භාවිතය දිරිමත් කිරීම, ඉදිකිරීම් කර්මාන්තය සම්බන්ධ ජාතික දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඵ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අදාළ නීතිරීතිවලට අනුකූලව කාල රාමු තුළ සහ අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව ප්‍රකාශ කිරීම

(අ) 2018 වසරේ සිට 2021 දක්වා වූ කාලයට මහා භාණ්ඩාගාරයෙන් වරින් වර විවිධ කාර්යයන් සඳහා ලැබුණ මුදල් දළ වශයෙන් රු. මිලියන 202 රු. මිලියන 410ක් දක්වා වූ මුදල් සෑම මසකම අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මගින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිනුමේ කිසිදු කටයුත්තක් සඳහා ප්‍රයෝජන නොගෙන නිෂ්කාර්යව රඳවා තබා තිබුණි. එම ශේෂය 2022 පෙබරවාරි මාසය අවසන් වන විට රු. මිලියන 414.8 ක් දක්වා අඛණ්ඩව ඉහළ ගොස් පැවතුණි. ඉහත මුදල් බැංකු ජංගම ගිණුමක නිෂ්කාර්යව තැබීමට ඉඩ හැරීමෙන් 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ රජයට දළ වශයෙන් රු. මිලියන 96.3 කම මූල්‍ය පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) රු.6,412,500 ක් වටිනා වාහන 4 ක් දිරා යාමට ඉඩ හරිමින් අධිකාරියට අයත් ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු මධ්‍යස්ථානයෙහි වසර 3කට අධික කාලයක් තිස්සේ 2022 මාර්තු 31 දින වන විටත් භාවිතයකින් තොරව පැවතුණි. මේ සම්බන්ධයෙන් නිකුත් කර 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි වත්කම් අලුත්වැඩියාවට හෝ අපහරණය කිරීමට කටයුතු සිදු කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) විවිධ අරමුණු සඳහා ලබා දී තිබුණු රු. 1,347,357 ක් වන අත්තිකාරම් ශේෂ 16 ක් හා පෙරගෙවුම් ශේෂයන් වසර 5කට අධික කාලයක් තිස්සේ අඛණ්ඩව පියවීමකින් තොරව ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවුම් මුදල් රු.3,141,125 ක් සහ එයින් රු. 2,274,459 ක් හෙවත් 72% ක් 2022 31 දින වන විටත් පියවීමකින් තොරව වසර 05 කට අධික කාලයක් පැවතුණි. එසේම, රු. 4,660,622 ක් වූ විවිධ ණයහිමියන් 2021 දෙසැම්බර් 31 වන විට වසර 05 කට වැඩි කාලයක් හිඟව පැවති අතර එයින් රු.687,517 ක් වාර්තා කරන දිනට වසර 10 කට වැඩි කාලයක් තිස්සේ පියවා නොතිබුණි. මේ අතර, මෙම ශේෂයන් 2022 අප්‍රේල් 30 වන විටත් නොවෙනස්ව පැවතිණි.

(ඇ) රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.3 ඡේදය අනුව නියමිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පැහැදිලිව නිර්වචනය කරන ලද ප්‍රධාන කාර්ය සාධක දර්ශක (KPIs) ක්‍රියාත්මක බව සහතික කිරීම සඳහා සහ එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සමාලෝචනය කිරීමට සහ අවශ්‍ය ඕනෑම තැනක නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට 2021 – 2025 සහ 2022 – 2026 කාලය සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සඳහා ඇමුණුම 1 හි දක්වා ඇති ආකෘතියට සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරි වසර සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර 2022 අප්‍රේල් 30 දිනට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදී සිටින ශිල්පීන් සඳහා ශිල්පී හැඳුනුම්පත් ලබාදීම සඳහා 2019 සහ 2020 වසර තුළ මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 35.7ක් ලැබී තිබුණි. එයින් රු.මිලියන 11.3 ක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වසරේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) වෙත අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණි. 2021 වර්ෂය තුළ ICTA මගින් රු.මිලියන 9.6 ක් එකඟ වූ කාර්යයන් ඉටු නොකර ආපසු ගෙවා තිබුණි. මෙම මුදල් 2022 අප්‍රේල් මස අවසන් වන තුරුත් අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා නොකර බැංකු ජංගම ගිණුමේ අක්‍රියව පැවතුණි. තවද, තොරතුරු තාක්ෂණ ආයතන විසින් තිබූ අත්තිකාරම් රු. මිලියන1.7 ක මුදල සම්බන්ධ තොරතුරු විගණනය සඳහා ලබා දී නොතිබුණි.

(ඉ) 2006 ජනවාරි 01 සිට 2011 මැයි 31 දක්වා කාලයට අදාළව රු. 14,977,525 ක හිඟ සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල (EPF) විසින් රු. 7,488,762 ක අධිභාර මුදලක් පනවා තිබුණි. කෙසේවෙතත්, මෙම ගෙවිය යුතු රු. 22,466,287 ක මුදල 2022 අප්‍රේල් 30 වන විටත් සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඊ) පවතින තොරතුරුවලට අනුව, 2003 ජූනි 02 දිනැති යහපාලනය සඳහා වූ අංක PED/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 වගන්තියේ විධිවිධානවලට පටහැනිව, අධිකාරිය විසින් 2022 සහ 2021 වර්ෂවලදී අධිකාරියේ සේවකයන් දෙදෙනෙකු රේඛීය අමාත්‍යාංශයට නිදහස් කර ඇත. තවද, මෙම නිලධාරියාට අධිකාරිය විසින් 2021 දෙසැම්බර් 31 දින දක්වා ගෙවා ඇති වැටුප් සහ අනෙකුත් දීමනා 2022 අප්‍රේල් 30වන දින වන විටත් රේඛීය අමාත්‍යාංශයෙන් ගණනය කර ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ල) අධිකාරියේ සේවයේ යෙදී සිටියදී බරපතල විෂමාචාර සහ රාජ්‍ය මුදල් අවභාවිතය සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ (මුදල්) ගේ සේවය අවසන් කර ඇත. කෙසේ වෙතත්, මෙම නිලධාරියා විසින් සිදු කරන ලද විෂමාචාර සහ මහජන මුදල් අවභාවිතය පිළිබඳව විගණකාධිපතිවරයා දැනුම්වත් කර නොතිබුණි. තවද, අධිකාරියේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා 2022 අප්‍රේල් 08 සිට ක්‍රියාත්මක වන පරිදි සිය තනතුරෙන් ඉල්ලා අස් වී ඇත. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා එම පුරප්පාඩු පිරවීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ළ) අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සේවය 2021 ජනවාරි මාසය තුළ අවසන් කිරීම හේතුවෙන් ඔහු විසින් රු. 1,956,538 කට ආසන්න වන්දි මුදලක් ඉල්ලා කම්කරු විනිශ්චය සභාවෙහි නඩුවක් ගොනු කර තිබුණි. මෙසේ ඔහුගේ සේවය අවසන් කිරීමට ගත් අයථා සහ නීති විරෝධී කළමනාකරණ තීරණය හේතුවෙන් අධිකාරියට මෙම අලාභය සිදු වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර මෙම තනතුර ද 2022 මාර්තු 31 දින දක්වා පුරප්පාඩු වී තිබුණි.

**අත්සන් කලේ - ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න**
**විගණකාධිපති**

## 4.0 කාර්ය සාධන දර්ශක

| අංකය | විශේෂිත දර්ශක | තත්‍ය ප්‍රතිදානය අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|
| | | 100%- 90% | 75%-89% | 50%-74% |
| 1 | ඉදිකිරීම් කර්මාන්තයේ අධීක්ෂණය සහ නියාමනය | | | |
| 1.1 | කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම | | | 53% |
| 1.2 | ව්‍යාපෘති පදනම මත විදේශීය කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම | >100 | | |
| 1.3 | දේපල සංවර්ධකයින් ලියාපදිංචි කිරීම සහ ඔවුන්ගේ නාමාවලිය පවත්වාගෙන යාම | | | <50% |
| 1.4 | ඉදිකිරීම් කම්කරුවන් ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම | | | <50% |
| | | | | |
| 2 | අධීක්ෂණය සහ නියාමනය | | | |
| 2.1 | හඳුනාගත් ඉදිකිරීම් කටයුතු දිරිමත් කිරීම සහ විශිෂ්ට ඉදිකිරීම් ඇගයීම සඳහා ජාතික සම්මාන පිරිනැමීම | >100 | | |
| | | | | |
| 3 | ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය ප්‍රමිති සහ පිරිවිතර සකස් කිරීම සහ කළමනාකරණය කිරීම | | | |
| 3.1 | ඉදිකිරීම් කර්මාන්තයේ පාර්ශ්වකරුවන් වෙනුවෙන් ඉදිකිරීම් කර්මාන්තයට අදාළ පිරිවිතර, සම්මත ලේඛන, සඟරා ආදිය නිකුත් කිරීම. | >100% | | |
| 3.2 | තාක්ෂණික විගණන ක්‍රියාවලිය පවත්වාගෙන යාම | | | <50% |
| 3.3 | තාක්ෂණික විගණකවරුන් ලියාපදිංචි කිරීම | >100% | | |
| | | | | |
| 4 | ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | | |
| 4.1 | NVQ 4 රාමුව යටතේ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන (CETRAC) | | | <50% |
| 4.2 | අධ්‍යාපනික වැඩසටහන් (CHPB) යටතේ NVQ 4 මට්ටමේ පාඨමාලා පැවැත්වීම | | 83% | |
| 4.3 | මූලික ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු පුහුණු වැඩසටහන BACEM (OTC) | | | <50% |
| 4.4 | නිපුණතා සංවර්ධන කෙටි කාලීන පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණ (CETRAC) | | | <50% |
| 4.5 | ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීම "ශ්‍රම සිකුරු" | | | <50% |